# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,928 — 1970 ඔක්තෝබර් 16 වැනි සිකුරාදා — 1970.10.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුසාර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවලට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1451 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1470 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1472 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1479 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 1481 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1480 | විවිධ දැන්වීම් ... ... ... ... | 1482 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අනාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

**උඳීපියට පළවන** සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. සඳහන් නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. ජී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරී කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන් හිදී හැර ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබා ගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේ දී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත් වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාලපරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. සවකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින් ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයෙකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිටි රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාල නො වන්නේ ය.)

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රැජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔව්නු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනක් යන මේ දෑතුර තමන් සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාගීයෙනි. එතෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින් ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීංමේදී ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත්ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

## කම්කරු දෙපාර්තමේන්තුව

### වඩු වැඩ පිළිබඳ උපදේශක තනතුරු

කම්කරු දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන්නා වූ වඩුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානවල උපදේශකයින් වශයෙන් පත් කර ගැනීම සඳහා පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිටපත් කර ගත් ඉල්ලුම්පත් 1970 ඔක්තෝබර් මස 31 වන දින හෝ ඊට පෙර වෘත්තීය අභ්‍යාස ශාඛාව 3 වන මහල, කම්කරු මහ ලේකම් කාර්යාලය, කොළඹ 5, කම්කරු කොමසාරිස් වෙත එවිය යුතුයි.

**දීමනාව.**—සියල්ල ඇතුළත් රු. 400 සිට රු. 450 දක්වා වූ මාසික දීමනාවකි.

**සටහන.**—ගෙවන නියම ගාස්තුවේ ප්‍රමාණය තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රවීණත්වය අනුව තීරණය කෙරේ.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—

(අ) පත්වීම, කම්කරු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි, පළමුවෙන්ම එක් අවුරුද්දකට කොන්ත්‍රාත්තු පදනමක් මතවේ.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ කවර පළාතකට හෝ පත් කරන්නට යෙදෙනවා ඇත.

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරුවන් මුදලින් රු. 1,000 ක් බැගින් ඇප තැබිය යුතුය.

**3. වයස් සීමාව.**—වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ. (රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

4. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(1) **අධ්‍යාපනික :**

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් වත් ලබා ගන්නා ලද අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ), හෝ

(ආ) එයට සමාන හෝ උසස් සහතිකයක් සමඟ

(2) **කාර්මික :**

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ අවසාන සහතිකය, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකයින්ගේ සහතිකය, හෝ

(ඇ) එයට සමාන හෝ උසස් සහතිකයක් ලැබීමෙන් පසුව වඩු වැඩ හෝ වඩු කාර්මික වැඩ පරිපාලනය කිරීම සම්බන්ධ පස් අවුරුද්දක පළපුරුද්දක්.

**සටහන.**—(ආධුනික කාලයක් ඇත්නම් එයත් සමඟ) මේ වෘත්තීය පිළිබඳව 15 අවුරුද්දක පළපුරුද්දක් ඇති යටත් පිරිසෙයින් 7 වැනි ප්‍රමාණයවත් සමත් අයදුම්කරුවන්ටද මේ තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක.

5. අයදුම්කරුවන්ට වෘත්තීය පරීක්ෂණයකින් සමත්වීමට සිදුවේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. යම්කිසි විටක දී අයදුම්කරුවන්ව තෝරා ගැනීමට ලැබුනහොත් ඔහුව

සේවයෙන් මුදවා හැරීමට හැකිද නොහැකිද යන වග එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුය.

7. ඉල්ලුම්පත් ලත් බව දන්වන නොලැබේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය, කොළඹ 5,
1970.10.8 වන දින.

## ඉහත සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍රය

### වඩු උපදේශකවරුන් සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
4. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ :————.
(ආ) අයදුම්කරුගේ පියාගේ :————.
5. ජාතික තත්ත්වය :————.
6. ඉහළම අධ්‍යාපන සුදුසුකම :————.
(සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
7. උපදෙස් දීමට හැක්කේ :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.
8. අවුරුදු කීයක පළපුරුද්දක් තිබේද ? :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
9. චරිත සහතික ලබාගත් අයගේ නම් :—
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
(1) ————.
(2) ————.
10. වැඩිමනත් විස්තර :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තෝරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වීමට පැමිණෙනවත් හැර, තෝරීමට පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහ කිරීමට සිදුවන බව දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–600/1—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## කම්කරු දෙපාර්තමේන්තුව

### මේසන් වැඩ පිළිබඳ උපදේශක තනතුරු

කම්කරු දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යන්නා වූ මේසන්වරුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානවල උපදේශකයින් වශයෙන් පත් කර ගැනීම සඳහා පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිටපත් කර ගත් ඉල්ලුම්පත් 1970 ඔක්තෝබර් මස 31 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ වෘත්තීය අභ්‍යාස ශාඛාව, 8 වන මහල, කම්කරු මහ ලේකම් කාර්යාලය, කොළඹ 5, කම්කරු කොමසාරිස් වෙත එවිය යුතුය.

**දීමනාව.**—සියල්ල ඇතුළත් රු. 400 සිට රු. 450 දක්වා වූ මාසික දීමනාවකි.

**සටහන.**—ගෙවන නියම ගාස්තුවේ ප්‍රමාණය තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රවීණත්වය අනුව තීරණය කෙරේ.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—**

(අ) පත්වීම, කම්කරු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි, පළමුවෙන්ම එක් අවුරුද්දකට කොන්ත්‍රාත්තු පදනමක් මතවේ.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ කවර පළාතකට හෝ පත් කරන්නට යෙදෙනවා ඇත.

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරුවන් මුදලින් රු. 1,000 ක් බැගින් ඇප තැබිය යුතුය.

3. **වයස් සීමාව.**—වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ. (රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

4. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(1) **අධ්‍යාපනික :**

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් වත් ලබා ගන්නා ලද අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ), හෝ

(ආ) එයට සමාන හෝ උසස් සහතිකයක් සමඟ

(2) **කාර්මික :**

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ අවසාන සහතිකය, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකයින්ගේ සහතිකය, හෝ

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ (සන්ධ්‍යාකාල පාඨමාලාව හැදෑරීම පිළිබඳ) සහතිකය,

හෝ

(ඇ) එයට සමාන හෝ උසස් සහතිකයක් ලැබීමෙන් පසුව ගොඩනැගිලි තැනීමේ වැඩ පරිපාලනය කිරීම සම්බන්ධ පස් අවුරුද්දක පළපුරුද්දක්.

**සටහන.**—(ආධුනික කාලයක් ඇත්නම් එයත් සමග) මේ වෘත්තීය පිළිබඳව 15 අවුරුද්දක පළපුරුද්දක් ඇති යටත් පිරිසෙයින් 7 වැනි ප්‍රමාණයවත් සමත් අයදුම්කරුවන්ටද මේ තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක.

5. අයදුම්කරුවන්ට වෘත්තීය පරීක්ෂණයකින් සමත්වීමට සිදුවේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. යම්කිසි විටක දී අයදුම්කරුවන්ව තෝරා ගැනීමට ලැබුනහොත් ඔහුව සේවයෙන් මුදවා හැරීමට හැකිද නොහැකිද යන වග එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුය.

7. ඉල්ලුම්පත් ලත් බව දන්වන නොලැබේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය, කොළඹ 5,
1970.10.8 වන දින.

## ඉහත සඳහන් කරන ලද ආකෘති පත්‍රය

### මේසන් උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
4. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ :————.
(ආ) අයදුම්කරුගේ පියාගේ :————.
5 ජාතික තත්ත්වය :————.
6. ඉහළම අධ්‍යාපන සුදුසුකම :————.
(සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
7. උපදෙස් දීමට හැක්කේ :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

8. අවුරුදු කීයක පළපුරුද්දක් තිබේද ? :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

9. චරිත සහතික ලබාගත් අයගේ නම් :—
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

(1) ————.

(2) ————.

10. වැඩිමනත් විස්තර :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වීමට පැමිණෙනවත් හැර, තේරීමට පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහ කිරීමට සිදුවන බව දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

10–600/2—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා නාවික හමුදව

### වැඩමූලික තනතුර (මෝටර් ප්‍රවාහණ)

රාජකීය ලංකා නාවික හමුදවේ (මෝටර් ප්‍රවාහණ) ඉහත සඳහන් වැඩමූලික තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 5,304 න් පටන් ගෙන රු. 144 වැඩිවීම් 9 කින් හා රු. 180 වැඩිවීම් 8 කින් රු. 8,040 තෙක් වැඩි වේ. රුපියල් 6,600 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. **අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) (i) ගණිතය හා භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සිංහල/දෙමළ භාෂාව, ගණිතය, භෞතික විද්‍යාව ඇතුළුව තවත් විෂයයන් තුනකින් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ලබන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) සහතිකය, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ප්‍රදානය කෙරුණු අවස්ථාවේදීම් ගණිතය, භෞතික විද්‍යාව සමත් නොවූයේ නම්, ඉක්බිති කුමන හෝ අවස්ථාවක ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයකින් එම විෂයයන්හි ලද සාමාර්ථ පිළිගනු ලැබේ ;

(ii) මෝටර් ප්‍රවාහණ වැඩවලට අදාල වෘත්තීන් පිළිබඳව පිළිගත් ඉංජිනේරු ආයතනයක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ අවුරුදු පහක ආධුනික කාලයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටීම ;

(iii) පැට්‍රල් සහ ඩීසල් තෙල්වලින් ක්‍රියා කරන එන්ජින් ඇති මෝටර් වාහනවල ක්‍රියාකාරිත්වය, ඒවා අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ අවුරුදු 8 ක මනා ප්‍රායෝගික දැනුමක් තිබිය යුතු අතර, ඉන් යටත් පිරිසෙයින් අවුරුදු 3 ක් පරිපාලන තත්ත්වයේ සිට ලබාගත් පුහුණුවක් ද විය යුතුය ;

(iv) විශාල මෝටර් වාහන අළුත්වැඩියා කරන වැඩපලක් ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ ප්‍රත්‍යක්ෂ දැනුමක් හා නවීනතම අත්හදා බැලීමේ උපකරණ සම්බන්ධව හා වාහන නඩත්තු කිරීමේ ප්‍රතිසංවිධානයට අදාල සියළුම අතුරු අංශවල මනා අවබෝධයක් ද තිබිය යුතුය.

එසේ නැතහොත්,

(ආ) (i) ගණිතය, භෞතික විද්‍යාව හෝ සාමාන්‍ය විද්‍යාව හෝ විෂයයන් වශයෙන් ඇතුව පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍රය හෝ මූලික පාඨශාලා හැර යාමේ විභාගය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් පාසැලකින් පවත්වන ලද කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් පාසැලක 8 වැනි පන්තිය නැත්නම් පාඨශාලා කණිෂ්ඨ පන්තිය සමත්ව සිටීම ;

(ii) වඩුවැඩ, ලෝහ තහඩු වැඩ, වැල්ඩිං වැඩ, කම්හල් වැඩ, ඊයම් වැඩ සහ රිවෙට් කිරීම ආදී වූ නැව් තැනීම හා අළුත්වැඩියා කිරීම සම්බන්ධ වෘත්තීන් පිළිබඳ පිළිගත් ඉංජිනේරු සමාගමක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ අවුරුදු පහක ආධුනික කාලයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටීම ;

(iii) පැට්‍රල් සහ ඩීසල් තෙල්වලින් ක්‍රියා කරන එන්ජින් ඇති මෝටර් වාහනවල ක්‍රියාකාරිත්වය, ඒවා අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ අවුරුදු 10 ක මනා ප්‍රායෝගික දැනුමක් තිබිය යුතු අතර ඉන් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක් පරිපාලන තත්ත්වයේ සිට ලබාගත් පුහුණුවක් ද විය යුතුය ;

(iv) විශාල මෝටර් වාහන අළුත්වැඩියා කරන වැඩපලක් ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ ප්‍රත්‍යක්ෂ දැනුමක් හා නවීනතම අත්හදා බැලීමේ උපකරණ සම්බන්ධව හා වාහන නඩත්තු කිරීමේ ප්‍රතිසංවිධානයට අදාල සියළුම අතුරු අංශවල මනා අවබෝධයක් ද තිබිය යුතුය.

4. **අවශ්‍ය වෙනත් සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් ද ලබා ඇති බවට සෑම අයදුම්කරුවෙක්ම සාක්ෂි සැපයිය යුතුය :—

(i) 1970 ඔක්තෝබර් 6 දිනට අවුරුදු 18 ට නොඅඩු, 45 ට නොවැඩි වීම (දෙපාර්තමේන්තු සේවකයින් කෙරේ මෙම වයස් සීමාව බල නොපානු ඇත) ;

(ii) යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍යයකින් සමන්විත වීම.

5. **සේවා නියමයෝ.**—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ද සහිතය. තෝරා ගනු ලබන අපේක්ෂකයා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය ;

(ii) තෝරාගත් අයදුම්කරු කෙටිකාල දැන්වීමකින් රාජකාරි භාරගත යුතුවාක් මෙන්ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ද සූදානම්ව සිටිය යුතුය. දැනට කොළඹ, ත්‍රිකුණාමලය, කරෙයිනගර් සහ කල්පිටිය යන ස්ථානයන්හි නාවික හමුදා ආයතනයන් පිහිටුවා ඇත.

6. **සේවා කොන්දේසි.**—තෝරා පත්කර ගනු ලබන අපේක්ෂකයා රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව රාජ්‍ය සේවයේ නව ප්‍රවේශකයකු නම්—

(i) පරිවාස කාලය අවුරුදු 3 ක් වේ ;

(ii) 1956 වර්ෂයේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම විශේෂ කොට ඇතිව රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් මෙතෙක් පනවා ඇත්තාවූද, මතුවට පැනවිය හැකිවූද, සියලු ව්‍යවස්ථාවලට අවනත විය යුතුය ;

(iii) පරිවාස කාලය තුළ රාජ්‍ය භාෂාව විෂයෙහි පහත (iv) පරිදි දැනුම ලබාගත යුතුය ;

(iv) පරිවාස කාලය අවසාන සේවයෙහි ස්ථිර කිරීම අතිකූත් කරුණු අතර පත්වීමේ දිනයෙහි සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු 2 ක් හා 3 ක් ඇතුළත III වැනි ශ්‍රේණියේ රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත් විය යුතුය. නියමිත කාලසීමාවන් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත් වැටුප් වැඩිවීම් අත්හිටවීමට හේතු වේ. නියමිත කාල සීමාවෙන් පසු තවත් හය මසක් ඇතුළත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත් වැටුප් වැඩිවීම අත්හිටවීම, වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය වී පරීක්ෂණ පවත්වන තෙක් බලපැවැත් වේ ;

(v) පරිවාස කාලය අවසානයෙහි රාජ්‍ය භාෂා විෂයෙහි නියමිත ප්‍රවීණතාවය ලබා නො ගතහොත් අංක 120 හා 121 වැනි පාලන රෙගුලාසි බලපැවැත් වේ.

(ඉහත දැක්වෙන අංක 3, 4 සහ 5 දරණ කොන්දේසි දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගන්නන්ට අදාල වෙයි).

7. ලංකාවේ පිහිටි එක්සත් රාජධානි කඳවුරු ආපසු ලංකාවට පවරා ගැනීම හේතුකොට ගෙන ලංකාවේ එක්සත් රාජධානි සේවාවන්හි නියුක්තව සිටි, 1956 ජූලි 6 වැනිදා හෝ ඊට පසු දිනක අස්කරනු ලැබූ සිවිල් සේවකයන් වෙනුවෙන් පහත සඳහන් පහසුකම් සලසා තිබේ :—

(i) නියම කරන ලද උපරිම වයස් සීමාව තුළ සිටීමට ඉඩ ලැබෙන සේ ඔවුන්ගේ වයසෙන් එක්සත් රාජධානි හමුදා සේවා කාලය අඩු කිරීම ;

(ii) **අධ්‍යාපනික සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය අවශ්‍ය සෑම අවස්ථාවකම කණිෂ්ඨයන්, කණිෂ්ඨ පාඨශාලා සහතිකය අවශ්‍ය සෑම අවස්ථාවකම අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම 7 ප්‍රමාණයන් ලෙස සැලකීම ;

(iii) ආධුනික කාලය හා පළපුරුද්ද.—ආධුනික කාලයක් අවශ්‍ය නැත. එහෙත් ඊට සරිලන සේ පළපුරුදු කාලය අවශ්‍ය ආධුනික කාලයට සමාන ප්‍රමාණයක්ම දීර්ඝ විය යුතුය.

8. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්වලට පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඈමිණිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා රෙගුලාසි සඳහා නිකුත් කරනු ලබන සහතික භාර ගනු නො ලැබේ) ;

(ii) ලබා ඇති ඉහළම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(iii) ලබා ඇති පළපුරුද්ද පිළිබඳ සහතික ;

(iv) ළඟදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ නියුතු අයදුම්කරුවන් විසින් චරිත සහතික සැපයීම අවශ්‍ය නොවේ).

9. මෙම ගැසට් පත්‍රිකාවේ I කොටසේ (II) ඡේදයෙහි ප්‍රසිද්ධ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරු සඳහා පත් කිරීම්වලට අදාල සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

10. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නවුන් තම තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

11. කලින් ලත් පළපුරුද්ද සහ යෙදී සිටි රක්ෂාවල් පිළිබඳ විස්තර ඉල්ලා ඇති පරිදි මෙහි පහත සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ දක්වමින්, කොළඹ, තැ. පෙ. 593, නාවික හමුදා මූලස්ථානයේ සිවිල් පාලන නිලධාරි සහ ගණකාධිකාරි වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ "වැඩමූලික මෝටර් ප්‍රවාහණ" තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය යන්න සඳහන් කර 1970 නොවැම්බර් 7 දිනට පෙර නාවික හමුදා මූලස්ථානයේ සිවිල් පාලන නිලධාරි සහ ගණකාධිකාරි වෙත ඉල්ලුම්පත් එවිය යුතුය.

එන්. තංගරාජා,
සිවිල් පාලන නිලධාරි හා ගණකාධිකාරි,
රාජකීය ලංකා නාවික හමුදාව.

1970 ඔක්තෝබර් 6 වැනි දින,
කොළඹ 1,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේදී ය.

### ආදර්ශ අයදුම්පත

රාජකීය ලංකා නාවික හමුදාව

වැඩමූලික තනතුර (මෝටර් ප්‍රවාහණ)

1. සම්පූර්ණ නම (ලොකු අකුරෙන්) :————.
2. ලිපිනය :—
   (1) පුද්ගලික :————.
   (2) කාර්යාලීය :————.
3. උපන් දිනය :————.
4. ජාතිය :————.
5. සිවිල් තත්ත්වය :————.
6. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාග විෂයයන් සමග යොදන්න) : ————.
7. කාර්මික හෝ අනිකුත් සුදුසුකම් :————.
8. ආධුනික, අභ්‍යාස පරිපාටි, පළපුරුද්ද ආදියේ විස්තර :————.
9. පාසැලෙන් අස්වූවාට පසු යෙදුන රක්ෂාවල් සම්බන්ධ විස්තර :————.
10. චරිත සහතික ලබාගෙන ඉදිරිපත් කරන තිදෙනෙකුගේ නම් :—
    (i) ————.
    (ii) ————.
    (iii) ————.
11. අනිකුත් තොරතුරු :————.

මෙම අයදුම්පතේ මවිසින් සඳහන් කර ඇති සියලු විස්තර සැබෑ බවත්, නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුරට තෝරා ගැනීමට ප්‍රථමයෙන් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙක් වන බවද, තෝරා ගැනීමෙන් පසු යම් කිසි තොරතුරක් අසත්‍ය බැව් අනාවරණය වුව හොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට යටත්වන බවද මම හොඳාකාර දන්නා බැව් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–525—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ ගන්නෑපත්තු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ ගල්බොඩ කෝරළ කොට්ඨාශයේ (උඩරට සහ සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

ගන්නෑපත්තු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාල යක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කායාීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායාීලයයන්, ග්‍රාම සේවක කායාීලයයන්, පළාත් පාලන ආයතනයන්, ග්‍රාමීය උසාවි, තැපැල් කායාීලයයන්, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, සමුපකාර සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කායාීලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1970 නොවැම්බර් 15 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

කේ. එච්. ජේ. විජේදාස,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 4 වෙනි දින,
කෑගල්ලේ දිස්ත්‍රික් ලේකම් කායාීලයේදීය.

10–464/1—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ කිරවැලි නැගෙනහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ බෙලිගල් කෝරළ කොට්ඨාශයේ (උඩරට සහ සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

කිරවැලි නැගෙනහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම් වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2 මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කායාීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායාීලයෙන්, ග්‍රාම සේවක කායාීලයයන්, පළාත් පාලන ආයතනයන්, ග්‍රාමීය උසාවි, තැපැල් කායාීලයයන්, පොලිස් ස්ථාන ප්‍රජා මණ්ඩල, සමුපකාර සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කායාීලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1970 නොවැම්බර් 15 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

කේ. එච්. ජේ. විජේදාස,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 4 වෙනි දින,
කෑගල්ලේ දිස්ත්‍රික් ලේකම් කායාීලයේදීය.

10–464/2—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුලුගම් නැගෙනහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කෝරළ තුන සහ පාතබුලත්ගම කොට්ඨාශයේ (උඩරට සහ සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

අටුලුගම නැගෙනහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දියනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයයන්, ග්‍රාම සේවක කාර්යාලයයන්, පළාත් පාලන ආයතනයන්, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාලයයන්, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, සමූපකාර සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1970 නොවැම්බර් 15 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

කේ. එච්. ජේ. විජේදාස,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 4 වෙනි දින,
කෑගල්ලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

10–464/3—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ එගොඩපත තනිප්පේරු පත්තු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ ගල්බොඩ කෝරළ කොට්ඨාශයේ (උඩරට සහ සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

එගොඩපත තනිප්පේරු පත්තු උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබියයුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයයන්, ග්‍රාම සේවක කාර්යාලයයන්, පළාත් පාලන ආයතනයන්, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාලයයන්, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, සමූපකාර සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1970 නොවැම්බර් 15 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

කේ. එච්. ජේ. විජේදාස,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 4 වෙනි දින,
කෑගල්ලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

10–464/4—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ කඳුඅඟ පත්තු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ පරණකුරු කෝරළ කොට්ඨාශයේ (උඩරට සහ සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

කඳුඅඟ පත්තු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයයන්, ග්‍රාම සේවක කාර්යාලයයන්, පළාත් පාලන ආයතනයන්, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාලයයන්, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, සමූපකාර සමිති. ප්‍රසිද්ධ වෙළඳ පොළවල් ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1970 නොවැම්බර් 15 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

කේ. එච්. ජේ. විජේදාස,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 4 වෙනි දින,
කෑගල්ලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

10–464/5—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ කඳුපිට පත්තුව දකුණ කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ බෙලිගල් කෝරළ කොට්ඨාශයේ (උඩරට සහ සාමාන්‍ය විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

කඳුපිට පත්තුව දකුණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයයන්, ග්‍රාම සේවක කාර්යාලයයන්, පළාත් පාලන ආයතනයන්, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාලයයන්, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, සමූපකාර සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1970 නොවැම්බර් 15 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

කේ. එච්. ජේ. විජේදාස,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 4 වෙනි දින,
කෑගල්ලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

10–464/6—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### කම්කරු සබඳතා නිලධාරි තනතුර

සෞඛ්‍ය අමාත්‍යාංශයේ කම්කරු සබඳතා නිලධාරි තනතුරක් අරබයා ලක්වැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි මතු දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුකරණයෙන් පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970.11.15 වනදා හෝ ඊට පෙර හෝ මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 6,024 කි. රු. 7,500 ක් ද වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇති, වසරකට රු. 5,448—144—8,040 කි.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති :**

(i) මෙය විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරකි ;

(ii) තෝරා ගනු ලබන අපේක්ෂකයා වැ. අ. වි. අරමුදලට දායක විය යුතු වේ ;

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක තහවුරු වී සිටින නිලධාරියෙකු මේ තනතුරට පත් කිරීමට තෝරා ගනු ලැබුවොත්, ඔහු පත් කරනු ලබන්නේ පළමුවෙන් නිශ්චිත කාලසීමාවක් වැඩ බැලීමේ පදනමිනි.

4. **අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම—

(අ) යහපත් චරිතයකින් ද මනා ශරීර සෞඛ්‍යයෙන් ද හෙබිය යුතුයි.

(ආ) 1970.11.15 වනදට වයසින් අවුරුදු 25 ට නො අඩු 40 ට නොවැඩි අය විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වී සිටින අයට ඉහළ වයස් සීමාව අදාළ නොවේ) ;

(ඉ) පිළිගත් විශ්ව විද්‍යාලයයෙක උපාධිධරයෙකු විය යුතුය. විශේෂ විෂයයක් හැටියට සමාජ විද්‍යාව හදාරා ඇති අයට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තුවක ශුභසාධක හා කම්කරු සබඳතා වැඩෙහි පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසු කමෙකි.

**සැලකිය යුතුයි.**—(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගයෙන් හෝ සිංහල/දෙමළ භාෂාව, ගණිතය/අංක ගණිතය ඇතුළු විෂයයන් 6 ක් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී පියවමින් සාමාන්‍ය පෙළ පොදු අධ්‍යයන සහතික විභාගයෙන් හෝ එගොඩ වී සිටින, රජය යටතේ දස අවුරුද්දකට නොඅඩු සේවා කාලයක් ඇති නිලධාරීන් කම්කරු සබඳතා නිලධාරියාගේ රාජකාරි ඉටු කිරීමට සුවිශේෂ කුසලතාවයක් හැකියාවක්ද ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා තමන් විසින්ම සහතික කරතොත්, එබඳු නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් කෙරෙහි ද සලකා බලනු ඇත.

(ii) මතු සඳහන් සුදුසුකම් කිසිවක් තිබේ නම්, රාජ්‍ය සේවයේ දැනටත් නියුක්ත නිලධාරීහු ද රජය යටතේ තම සේවා කාලයේ තරමක් නොතකා මේ තනතුර පතා අයදුම්පත් එවීමට නිස්සෝ වෙති :—

(අ) ලංඩන් විශ්ව විද්‍යාලයයේ මධ්‍යන්තර විභාගයෙන් එගොඩ වී සිටින, නැතහොත් ලංඩන් (උසස් පෙළ) පො. අ. ස. විභාගය ආශ්‍රයෙන් එකී විභාගයෙන් නිදහස් වී සිටින නිලධාරීන් ; නැතහොත්,

(ආ) ලංකා විශ්ව විද්‍යාලයයේ හෝ විද්‍යෝදය විශ්ව විද්‍යාලයයේ හෝ, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයයේ හෝ පළමු විභාගය ; නැතහොත්,

(ඉ) ලංකා උසස් පාඨශාලා සහතික විභාගය ; නැතහොත්,

(ඊ) කවර විෂය දෙකකින් වුවද සම්මාන ඇතිව ලැබූ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ, සිංහල/දෙමළ භාෂාව, ගණිතය/අංක ගණිතය ඇතුළු විෂය 6 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී පියවා ලබාගත් (සාමාන්‍ය පෙළ) පො. අ. සහතිකය හෝ සමග, එකම විභාගයේදී විෂය තුනක් නොහොත් දෙවතාවකදී විෂය හතරක් දිනමින් ලබා ගත් (ලංඩන් නොහොත් ලංකා) (උසස් පෙළ) පො. අ. සහතිකය.

5. මතු සඳහන් සුදුසුකම් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටෙක අපේක්ෂකයින් ඒවා ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය ;

(සැ. යු.—බවුතීස්ම සහතිකය වත්, උපකෘත පාසල් පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ ප්‍රයෝජනය සඳහා නිකුත් කරනු ලබන ලුහුඬු උප්පැන්න සහතිකය වත් මෙහි ලා බාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික ;

(ඉ) චරිත සහතික දෙකක්.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගිනි. එබඳු අයදුම්පත් ගැන සලකා බලන්නේ ඔවුන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ පත්වීමට තෝරා ගනු ලැබූ කල රාජකාරියෙන් මුදාලීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ වෙතොත් පමණි.

7. නියමිත දිනට පසු ලැබෙන අයදුම් පතක්, නියමිත දින හෝ ඊට කලින් හෝ තමා වෙත ලැබුණු බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කරමින්, එය ඉදිරිපත් කිරීමේ පමාව ගැන පිළිගත හැකි හේතු දක්වමින් එය පිළිගන්නා ලෙස නිර්දේශ කරතොත් මිස නැත්නම්, ඒ අයදුම්පත ගැන සලකා බලනු නො ලැබේ.

8. අයදුම්පත් ද, ඒ හා සම්බන්ධිත වෙනත් අනෙක් ලියුම් කියුම් ද එවිය යුත්තේ කොළඹ, තැ. පෙ. අංක 500, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තැනට ලිපිනය ලියා මිස, මේ කාර්යාලයේ කිසිදු නිලධාරියෙකුට නමින් අමතා නොවේ.

9. මේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) ඡේදය පටන් ගැනීමේදී පළ වී තිබෙන, රාජ්‍ය සේවයේ පත්වීම් කෙරෙහි පොදුවේ බලපාන කොන්දේසි ද කියවා බලනු වටී.

ජී. අමරසේන,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970.10.5 වනදා,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

### අයදුම්පතේ ආකෘතිය

### කම්කරු සබඳතා නිලධාරි තනතුර

1. මුළු නම :————.
(පැහැදිලි වටකුරු අකුරෙන්)

(අ) පෙළපත් නම :————.

(ආ) අනෙකුත් නම් :————.

2. ලිපිනය :————.
(වෙනසක් වේ නම් ඒ වග එවිගසින් දැනුම්දිය යුතුයි.)

3. උපන් දිනය :————.

4. 1970.11.15 වනදට හරි වයස :—
අවුරුදු :——— යි, මාස :——— යි, දින :——— යි.

5. විවාහක ද තනිකඩ ද යන වග :————.

6. අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් :————.

7. කම්කරු සබඳතා සහ ශුභසාධක වැඩෙහි පළපුරුද්ද :————.

8. පාසලෙන අස්වූ දා පටන් කළ රැකියා වගතුග :————.

9. චරිත සහතික ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ කාගෙන්ද, ඒ අයගේ නම් :————.

10. විශේෂ හිමිකම් කිසිවක් වෙතොත් එය :————.

මේ අයදුම් පතෙහි මවිසින් සපයන්නට යෙදුණු තොරතුරු සැබෑ බවත්, හරි බවත්, මෙසින් සහතික කරමි. මෙහි අඩංගු යම් තොරතුරක් වැරදි බව දක්නට ලැබුණොත්, තේරීමට කලින් නම් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ වරද දක්නට ලැබුණොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු 4 ඡේදයේ (1) සැලැකියේ ප්‍රකාර සුදුස්සෙක්ද යන වගට දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :—

10–488—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

අංකය : සාප/5/85.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### II වැනි ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති II වැනි ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුරු සඳහා පහත දක්වා තිබෙන පරිදි හිමිකම් ඇති ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ වූ අයදුම්පත් 1970 ඔක්තෝබර් මස 31 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරයි. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනන්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**3. වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය : රු. 3,144—15 × 144—රු. 5,304යි. රු. 3,720 (වාර්ෂික) හා රු. 4,584 (වාර්ෂික) ඉක්මවා යාමට පෙර කාර්යක්ෂමතා කඩයිම් වලින් සමත් විය යුතුය. (මූලික වැටුප් පරිමාණය : රු. 1020—120 × 15—රු. 2,820).

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන III වැනි ශ්‍රේණියේ රසායනාගාර සහකාරයකු හෝ I වැනි ශ්‍රේණියේ හෝ II වැනි ශ්‍රේණියේ රසායනාගාර සේවකයෙකු විය යුතුය.

(ii) රසායනාගාරවල යටත් පිරිසෙයින් අවුරුදු 5ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුයි.

(iii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ වාර දෙකකට නොවැඩි ගණනකදී සිංහල/දෙමළ හා අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අ.පො.ස (සාමාන්‍ය පෙළ) ලබා තිබිය යුතුයි.

**නො එසේ නම්**

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවකයෙකු විය යුතුයි.

(ii) උසස් ගණිතය, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භූගර්භ විද්‍යාව, සත්ව විද්‍යාව, ජ්‍යාමිතිසික හා යාන්ත්‍රික ඇඳීම යන විෂයයන් අතරින් සම්මාන 2ක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ එම විෂයයන් අතරින්ම සම්මාන 2ක් සහිතව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ උසස් විභාගයක සාමාර්ථය ලබා තිබිය යුතුයි.

**සහ**

(ඇ) අවුරුදු 18ට නො අඩු හා අවුරුදු 24ට නො වැඩි විය යුතුයි. දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ. තෝරාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5. පත් කර ගනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් වලට අදාලවන පොදු කොන්දේසි වෙතද අවධානය යොමු කරවමි.

7. සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කර ඇති දිනයට පසුව එවන අයදුම්පත් බාර ගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු ලැබේ. එසේකුදු වුවත් ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනු පිටපතක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

8. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු ඇත. ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ඇතුළත පිළිතුරක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.10.9 වැනිදා,
කොළඹ 2,
මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දී.

අංකය : සාප/5/85.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### අධ්‍යාපන අමාත්‍යාංශය

### II වැනි ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිළි අකුරෙන්) :————

2. ස්ථිර ලිපිනය :————.

3. සේවා ස්ථාන ලිපිනය :————.

4. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට නියම වයස :————. උපන් දිනය :————.

5. අධ්‍යාපන සුදුසුකම්, විෂයයන් සහ සම්මාන, (වර්ගය සඳහන් කළ යුතුයි) :————.

6. දැනට යෙදී සිටින—(i) තනතුර :————.
(ii) ශ්‍රේණිය :————.
(iii) ඊට පත්වූ දිනය :————.
(iv) එම තනතුරේ සේවා කාලය :————
(v) වැටුප් ක්‍රමය :————.

7. රසායනාගාර සේවයේ පළපුරුද්ද පිළිබඳ විස්තර :—
රසායනාගාර සේවක හා/හෝ සහකාර වශයෙන් සේවා කාලය : ————.

8. ඔබට විරුද්ධව විනයානුකූල කටයුතු කර තිබේද ? :————. එසේ නම් ඒ ගැන විස්තර සඳහන් කරන්න.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසුව වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

මගේ අංකය :
ඔබේ අංකය : සාප/5/85.

අධ්‍යා/ලේ.,

මෙම අයදුම්පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයට* පසුය/පෙරය.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් සියලුම විස්තර* පහත සඳහන් සංශෝධනයන්ට යටත්/නිවැරදි බැව් මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

............................................................

............................................................

............................................................

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :————.

දිනය :————.

(* අදාල නැති කොටස් කපා හරින්න.)

10-599—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

(බෞතීස්ම සහතික, ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිතයට පමණක් නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ ජන්ම පත්‍රය භාරගනු නො ලැබේ),

(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය,

(3) ඉල්ලුම්කරුගේ චරිත ශුද්ධිය සහ මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතකදී ලබාගත් සහතික තුනක්, රක්ෂාවක යෙදී සිටින්නේ නම් මින් එක් සහතිකයක් තමාගේ ස්වාමියාගෙන් විය යුතුය.

(4) ක්‍රීඩා, ශිෂ්‍යභට පිළිබඳ සහතික ආදිය.

**සැලකිය යුතුයි.**—(1) මෙම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් පමණි.

(2) ඉල්ලුම් පත්‍රය සමග සහතිකවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැති වුවහොත් ඊට යුද හමුද මූලස්ථානය වග කියනු නොලැබේ.

(ඇ) තැපැලේදී නැතිවන, ප්‍රමාද වන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදල ලිපියක් පිළිබඳව කෙරෙන චෝදනාවක් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) ස්වේච්ඡා හමුදවල සාමාජිකයින්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ ඒකක මූලස්ථාන මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(උ) දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, ඉල්ලුම් පත්‍ර භාරගන්නා දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දෙපාර්ත මේන්තුවලට ලැබී, යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

(ඌ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ සඳහා තමාගේම වියදමින් පැමිණ පෙනී සිටිය යුතුයි. එම ඉල්ලුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(එ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසු යයි තෝරාගන්නා ලද ඉල්ලුම්කරුවන්, වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේ වියදමින් කොළඹදී පෙනී සිටිය යුතුය.

(ඒ) සම්මුඛ පරීක්ෂණයෙන් සහ යුද හමුද තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්ෂණවලින් පසුව යුද හමුද නිත්‍ය භටසේනාවේ ආධුනික සෙබල තනතුරට බඳවා ගන්නා අතර යුද හමුද අභ්‍යාස මධ්‍යස්ථානයේ හෝ අන් තැනක පවත්වනු ලබන පුහුණුවීමේ අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කිරීමට සලසනු ලැබේ.

(ඔ) වයස අවුරුදු 21 ට අඩු අය තමාගේ දෙමාපියන්ගේ හෝ භාරකාරයන් ගෙන් කැමැත්ත පළමු කොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම් නිත්‍ය භටසේනාවට බඳවා ගනු නොලැබේ.

(ඕ) තෝරා පත්කරගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශේෂයෙන් 1956 අංක **33** දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතුවට පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ක) ඉල්ලුම්කරු රෙකමදරු කිරීමට කැමති කෙනෙකු වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුගේ තෝරා ගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුසු අයකු වීමට ඉඩ තිබේ.

(ග) යම් ඉල්ලුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොර තුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දනගැනීමට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුසු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුනි නම් විනයානුකූලව දඬුවම් පැමිණවීමටත් රාජකාරියෙන් පහ කිරීමටත් ඉඩ තිබේ.

ඇම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදපති වෙනුවට.

යුද හමුද මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.

## ලංකා යුද හමුදවේ නිත්‍ය භටසේනාවේ සාමාන්‍ය (ආධුනික) සෙබලෙකු වශයෙන් බැඳීම සඳහාවූ ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය:———. වයස : අවුරුදු :——. මාස :——.

4. දින සහිත සමත්වූ විභාග, විෂයන් සමඟ :————.

5. උස: අඩි :————. අඟල් :————.

6. ඔබ ලංකා පුරවැසියෙක්ද :————.

7. විවාහක අවිවාහක බව :————.

8. පාසැලෙන් අස්වූවාට පසු යෙදී සිටි රක්ෂාව :————.

9. මීට ප්‍රථම යුද, නාවික, ගුවන් හා ස්වේච්ඡා සේවක හමුදවල දරූ තනතුරු ආදියක් වේ නම් තත්වය හා දිනය ඇතුළුව සම්පූර්ණ විස්තර :————.

10. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා ආදිය) :————.

11. ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවුඩ කාර්යාලය :————.

12. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

13. ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු—

(අ) :————.
(ආ) :————.
(ඇ) :————.

14. කොළඹ සේවා ආරෝග්‍යශාලාවේදී පවත්වන ලද වෛද්‍ය පරීක්ෂණය කින් අසමත්වීම නිසා ඔබ යුද හමුදවට, නාවික හමුදවට හෝ ගුවන් හමුදවට බඳවා ගැනීම ප්‍රතික්ෂේප කොට තිබේද ? :————.

15. ඉල්ලුම්කරු විසින් අත්සනින් කර සිටින ප්‍රකාශය :

මා විසින් සපයන ලද ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවට මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–516 —70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද්ධ හමුදවේ නිලධාරි තනතුරු

ලංකා යුද හමුද කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකායේ ආරක්ෂක සේනා ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කර ලබන අපේක්ෂකයන් ලංකා යුද හමුදවේ දෙවැනි ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරි පත්වීම් පිරිනමනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවන්ට පහත දක්වා ඇති පරිදි ඔහුගේ නිලයට අනුකූලවූ වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. මේජර් නිලයට ඉහල උසස් කිරීම තේරීම් අනුව වේ.

**දෙවැනි ලුතිනන්**—වාර්ෂික වැටුප—රු. 7,140/–
(මාසික ැටුප රු. 595/–)

ලුතිනන්—වාර්ෂික වැටුප—රු. 7,500—5 × 180—රු. 8,400
(මාසික වැටුප—රු. 625—5 × 15—රු. 700)

කපිතන්—වාර්ෂික වැටුප—රු. 9,240—8 × 180—රු. 10,680
(මාසික වැටුප—රු. 770—8 × 15—රු. 890)

මේජර්—වාර්ෂික වැටුප—රු. 11,400—8 × 240—රු. 13,320
(මාසික වැටුප—රු. 950—8 × 20—රු. 1,110)

ලුතිනන් කර්නල්—වාර්ෂික වැටුප—රු. 15,000—7 × 360—රු. 17,520
(මාසික වැටුප—රු. 1,250—7 × 30—රු. 1,460)

**විවාහක නිලධාරින්ගේ දීමනාව—**

මසකට රු. 575 හා රු. 600 ට = මසකට රු. 80.00

මසකට රු. 600 හා රු. 625 ට = මසකට රු. 82.50

මසකට රු. 625 හා රු. 650 ට = මසකට රු. 85.00

මසකට රු. 650 හා රු. 675 ට = මසකට රු. 87.50

මසකට රු. 675 හා රු. 700 ට = මසකට රු. 90.00

මසකට රු. 700 හා රු. 725 ට = මසකට රු. 92.50

මසකට රු. 725 හා රු. 750 ට = මසකට රු. 95.00

මසකට රු. 750 හා රු. 775 ට = මසකට රු. 97.50

මසකට රු. 775 හා ඉන් ඉහළ = මසකට රු. 100.00

**වෙනත් දීමනා.—**

(i) මූලික නිල ඇඳුම් දීමනාව—රු. 1,000.00

(ii) නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව—මසකට රු. 25.00

(iii) අනුගාමික දීමනාව.—විවාහක නිලධාරීන්ට හ පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00 ක්.

(iv) වෙන්ව සිටීමේ දීමනාව.—

(i) සාමාන්‍ය රාජකාරී සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14 කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්,

(ii) හදිසි හා විශේෂ රාජකාරී සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14 කට වැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගිනි.

(v) ගමන් හා ඒකාබද්ධ දීමනා.—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ඈ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදු වැටුප් සංග්‍රහය,

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි,

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය,

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද හමුදු මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(අ) **ජාතිය.**—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) **වයස.**—ඉල්ලුම්කරුවන් 70.11.5 වැනි දිනට වයස අවුරුදු 28ට නොවැඩි විය යුතුයි.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ඔවුන්ට තිබෙන බවට අපේක්ෂකයින් විසින් සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) ලන්ඩන් සිවිල් ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන විභාගයේ I වැනි II වැනි කොටස් වලින් සාමාර්ථය ලැබූ., හෝ

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු ශිල්පය පිළිබඳ පරීක්ෂණයේ 1 වැනි කොටසින් (ඒ සහ බී අංශයෙන්) සාමාර්ථය ලබා සහ උපාධි පාඨමාලාව සම්පූර්ණ කර අවසාන (සිවිල්) 11 වැනි කොටස සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලැබූ ; හෝ

(iii) ඒ.එම්.අයි.සී.ඊ විභාගයේ 1 වැනි කොටසින් (ඒ සහ බී අංශයෙන්) සාමාර්ථය ලබා පුහුණුවීමේ පාඨමාලාවන් සම්පූර්ණ කර ඒ.එම්.අයි.සී.ඊ. විභාගයේ 11 වැනි කොටසට පෙනී සිටීම සඳහා පිළිගනු ලැබූ ; හෝ

(iv) සහකාර ඉංජිනේරුවන් වශයෙන් උසස් කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අය ; හෝ

(v) අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ ලංකා කාර්මික විද්‍යාලයේ කනිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල්) පාඨමාලාවන් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්මික සහයකයන්ගේ පාඨමාලා වෙන් හෝ සාමාර්ථය ලබා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ විශාල ඉංජිනේරු සමාගමක තුන් අවුරුදු කාලයකට නොඅඩු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති අය.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයදුම්කරුවන් යුද හමුදුවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතුයි.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත් තම අත් අකුරින් විය යුතු අතර, 70.11.5 දින දහවල් 12ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුදු මූලස්ථානය, තැ.පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පත් බහාලන කවරයෙහි "ආරක්ෂක සේවා ඉංජිනේරු තනතුර සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරී යෙකු තෝරා පත් කර ගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත් රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය,

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන් ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරාපත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරා ගත් ඉල්ලුම් කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවන්ට, එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරාපත් කර ගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍යවේ.

10. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් අඩු කර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් දිය යුත්තේය.

11. ආරක්ෂක සේවා ඉංජිනේරු තනතුරු සම්බන්ධයෙන් 1970 මාර්තු 13 වැනි දින අංක 14,897 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනය මෙයින් අවලංගු කෙරේ. මෙම නිවේදනය අනුව ඉල්ලුම් පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත ඉල්ලුම් කළ යුතුවේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදු ආඥාපති වෙනුවට.

1970 ඔක්තෝබර් මස 9 වැනි දින.

**ලංකා යුද්ධ හමුදු කාර්ය සේවා ලංකා ඉංජිනේරු බලකායේ**

**ආරක්ෂක සේනා ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය : (ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද ? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න) :————.

3. ලිපිනය :

කාර්යාලයේ :————.

වාසස්ථානයේ :————.

4. උපන් දිනය : (1970.11.5 වැනි දිනට වයස) :

අවුරුදු :————. මාස :————. දින :————.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ දැන් ලිපිනය :————.

මවගේ :————.

පියාගේ :————.

6. ඔබ විවාහකද? අවිවාහකද ? :————.

7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බලසේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොන වාද? :————.

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහිද? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද ? :————.

12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.

ඇතුලත්වූ දිනය :————.

අස්වූ දිනය :————.

සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණය :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—

ස්වාමි පක්ෂය :————.

රැකියාවේ ස්වභාවය :————.

සේවය කළ කාලය : ————දින සිට ————දින දක්වා

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය, ————.

10–549—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## ලංකා යුද්ධ හමුදවේ නිළධාරි ඇබෑර්තු

ලංකා යුද්ධ හමුදවේ, ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කාර්මික නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත් කර ගනු ලබන අපේක්ෂකයන් ලංකා යුද්ධ හමුදවේ, දෙවෙනි ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරි පත්වීම් පිරිනමනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවන්ට ඔහුගේ නිලයට අනුකූලවූ මෙහි පහත දක්වා ඇති වැටුප් හා දීමනා ගෙවනු ලැබේ :—

දෙවැනි ලුතිනන්—වාර්ෂික වැටුප් —රු. 7,140 (මාසික වැටුප රු. 595)

| | |
|---|---|
| ලුතිනන් | —වාර්ෂික වැටුප්—රු. 7,500—5 × 180—රු. 8,400 |
| | (මාසික වැටුප්—රු. 625—5 × 15—රු. 700) |
| කපිතන් | —වාර්ෂික වැටුප්—රු. 9,240—8 × 180—රු. 10,680 |
| | (මාසික වැටුප්—රු. 770—8 × 15 —රු. 890) |
| මේජර් | —වාර්ෂික වැටුප්—රු. 11,400—8 × 240—රු. 13,320 |
| | (මාසික වැටුප්—රු. 950—8 × 20 —රු. 1,110) |
| ලුති-කර්නල් | —වාර්ෂික වැටුප්—රු. 15,000—7 × 360—රු. 17,520 |
| | (මාසික වැටුප්—රු. 1,250—7 × 30 —රු. 1,460) |

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

**විවාහක නිලධාරීන්ගේ දීමනාව.—**

| | | |
|---|---|---|
| මසකට රු. 575 හා රු. 600 ට අඩු | = | මසකට රු. 80.00 |
| මසකට රු. 600 හා රු. 625 ට අඩු | = | මසකට රු. 82.50 |
| මසකට රු. 625 හා රු. 650 ට අඩු | = | මසකට රු. 85.00 |
| මසකට රු. 650 හා රු. 675 ට අඩු | = | මසකට රු. 87.50 |
| මසකට රු. 675 හා රු. 700 ට අඩු | = | මසකට රු. 90.00 |
| මසකට රු. 700 හා රු. 725 ට අඩු | = | මසකට රු. 92.50 |
| මසකට රු. 725 හා රු. 750 ට අඩු | = | මසකට රු. 95.00 |
| මසකට රු. 750 හා රු. 775 ට අඩු | = | මසකට රු. 97.50 |
| මසකට රු. 775 හා ඉන් ඉහල | = | මසකට රු. 100.00 |

**වෙනත් දීමනා .—**

i. මූලික නිල ඇඳුම් දීමනාව.—රු. 1,000.00.

ii. නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව.— මසකට රු. 25.00.

iii. අනුගාමික දීමනාව—විවාහක නිලධාරීන්ට හා පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00 ක්.

iv. වෙන්ව සිටීමේ දීමනාව.— (i) සාමාන්‍ය රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට දින 14 කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්.

(ii) හදිසි හා විශේෂ රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම. කර ඇති විවාහක නිලධාරීන්ට දින 14 කට වැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගින්.

v. ගමන් හා ඒකාබද්ධ දීමනා.—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ඇ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,3`5 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද හමුද වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂක දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද හමුද මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුයි :—

(අ) ජාතිය.—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) වයස.—ඉල්ලුම්කරුවන් 1970.11.5 වැනි දින වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් .—

(i) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය සඳහා පාඨමාලාව සම්පූර්ණ කල හෝ ලංකා කාර්මික විද්‍යාලයේදී ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ලත් අයකු හෝ ඊට සමාන සුදුසුකම් ඇති රජයේ හෝ සංයුක්ත මංඩලයක හෝ දෙපාර්තමේන්තුවක හෝ ඕනෑම වර්ගයකට අයත් මෝටර් වාහන සඳහා එකම වෙළඳ නියෝජිත තැනගේ සමාගමෙහි මෝටර් යාන්ත්‍රික ශිල්පයෙහි අඩු කරමින් අවුරුදු 3 ක ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයකු

හෝ

(ii) ලන්ඩනයේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ මෝටර් වාහන ශිල්පීන් ගේ සහතිකය ලත් රජයේ හෝ සංයුක්ත මණ්ඩලයක හෝ දෙපාර්තමේන්තුවක හෝ ඕනෑම වර්ගයකට අයත් මෝටර් වාහන සඳහා එකම වෙළඳ නියෝජිත තැනගේ සමාගමෙහි අවුරුදු 8 කට නොඅඩු මෝටර් යාන්ත්‍රික ශිල්පයෙහි ප්‍රායෝගික පලපුරුද්ද ඇති අයකු

හෝ

(iii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සමත්වූ රජයේ හෝ සංයුක්ත මණ්ඩලයක හෝ දෙපාර්තමේන්තුවක හෝ ඕනෑම වර්ගයකට අයත් මෝටර් වාහන සඳහා එකම වෙළඳ නියෝජිත තැනගේ සමාගමෙහි යාන්ත්‍රික හෝ මෝටර් ඉංජිනේරු ශිල්පයෙහි අවුරුදු 5 කට නොඅඩු විශේෂ ඇප්‍රෙන්ටිස් පුහුණුවක් ලත් අයකු.

(ඈ) සෞඛ්‍ය තත්ත්වය—අයදුම්කරුවන් යුද හමුදවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතුයි.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම් පත් තම අත්අකුරින් විය යුතු අතර 1970.11.5 වැනි දින දවල් 12 ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද්ධ හමුද මූලස්ථානය තැ.පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කල යුතුය. ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ "ල.වි.යා.ඉ. කාර්මික නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම් පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම් පත් නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අතර, යම්කිසි නිලධාරි යෙකු තෝරාපත් කර ගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුයි. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය.

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම් කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරාපත් කර ගැනීම කරනු ලබන්නේ එසේ තෝරාපත් ඉල්ලුම් කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවන්ට, එය පවත්වන ස්ථානය, දිනය හා වේලාවන් ලියා දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍යවේ.

10. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩු කර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් දිය යුත්තේය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුද ආඥපති වෙනුවට.

1970 ඔක්තෝබර් 9 වැනි දින.

**ලංකා යුද්ධ හමුදවේ, ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කාර්මික නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ජාතිය :——— .

(ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද ? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න.)

3. ලිපිනය :

කාර්යාලයේ :————.

වාසස්ථානයේ :————.

උපන් දිනය :————.

1970.11.5 වැනි දිනට වයස :—

අවුරුදු————. මාස————. දින————.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානයේ සහ වත්මන් ලිපිනය :—

මවගේ :————.

පියාගේ :————.

6. ඔබ විවාහක ද ? අවිවාහක ද ? :————.

7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වෙච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහි ද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? :————.

12. ඔබගේ පාසැල් සමග විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.

ඇතුලත් වූ දිනය :————.

අස්වූ දිනය :————.

සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණය :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—.

ස්වාමි පක්ෂය :————.

රැකියාවේ ස්වභාවය :————.

සේවය කළ කාලය :————දින සිට————දින දක්වා.

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :—

1.————.

2.————.

මෙම අයදුම් පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–550—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද්ධ හමුදවේ නිලධාරි ඇබෑර්තු

ලංකා යුද හමුද කාර්‍ය සේවා ලංකා ඉංජිනේරු බලකායේ විදුලි හා යාන්ත්‍රික නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත් කර ගනු ලබන අපේක්ෂකයන් ලංකා යුද හමුදවේ දෙවැනි ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරී පත්වීම් පිරිනමනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවන්ට ඕහුගේ නිලයට අනුකූලවූ මෙහි පහත දක්වා ඇති වැටුප් හා දීමනා ගෙවනු ලැබේ:—

දෙවැනි ලුතිනන්—වාර්ෂික වැටුප රු. 7,140—(මාසික වැටුප රු. 595)

ලුතිනන්—වාර්ෂික වැටුප—රු. 7,500—5 × 180—රු. 8,400
(මාසික වැටුප රු. 625—5 × 15—රු. 700)

කපිතන්—වාර්ෂික වැටුප—රු. 9,240—8 × 180—රු. 10,680
(මාසික වැටුප—රු. 770—8 × 15—රු. 890)

මේජර්—වාර්ෂික වැටුප—රු. 11,400—8 × 240—රු. 13,320
(මාසික වැටුප—රු. 950—8 × 20—රු. 1,110)

ලුතිනන් කර්නල්—වාර්ෂික වැටුප—රු. 15,000—7 × 360—රු. 17,520
(මාසික වැටුප—රු. 1,250—7 × 30—රු. 1,460)

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

විවාහක නිලධාරීන්ගේ දීමනාව .—

| | |
|---|---|
| මසකට රු. 575 හා රු. 600 ට අඩු | = මසකට රු. 80.00 |
| මසකට රු. 600 හා රු. 625 ට අඩු | = මසකට රු. 82.50 |
| මසකට රු. 625 හා රු. 650 ට අඩු | = මසකට රු. 85.00 |
| මසකට රු. 650 හා රු. 675 ට අඩු | = මසකට රු. 87.50 |
| මසකට රු. 675 හා රු. 700 ට අඩු | = මසකට රු. 90.00 |
| මසකට රු. 700 හා රු. 725 ට අඩු | = මසකට රු. 92.50 |
| මසකට රු. 725 හා රු. 750 ට අඩු | = මසකට රු. 95.00 |
| මසකට රු. 750 හා රු. 775 ට අඩු | = මසකට රු. 97.50 |
| මසකට රු. 775 හා ඉන් ඉහළ | = මසකට රු. 100.00 |

**වෙනත් දීමනා**

(i) මූලික නිල ඇඳුම් දීමනාව රු. 1,000

(ii) නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව මසකට රු. 25.00

(iii) අනුගාමික දීමනාව.—විවාහක නිලධාරීන්ට හා පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00 ක්.

(iv) වෙන්ව සිටීමේ දීමනාව.— (i) සාමාන්‍ය රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14 කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්.
(ii) හදිසි හා විශේෂ රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14 කට වැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගින්.

(v) ගමන් හා ඒකාබද්ධ දීමනා.—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ඇ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද හමුද වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද හමුද මූලස්ථානයෙන් ලබාගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුයි—

(අ) **ජාතිය.**—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) **වයස.**—ඉල්ලුම්කරුවන් 1970.11.5 වැනි දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ඔවුනට තිබෙන බවට අපේක්ෂකයින් විසින් සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ උපාධියක් ලැබූ අය,
හෝ,

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු ශිල්පය පිළිබඳ උපාධි පරීක්ෂණයේ i කොටසින් සාමාර්ථය ලබා අවසාන (විදුලි) ii කොටස සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලැබූ අය,
හෝ

(iii) ඒ.එම්.අයි.ඊ.ඊ. විභාගයේ ii කොටසින් සාමාර්ථය ලබා iii කොටසට පෙනී සිටීම සඳහා පිළිගනු ලැබූ අය,
හෝ

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයෙ හෝ ලංකා කාර්මික විද්‍යාලයේ හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි) පාඨමාලාවෙන් සාමාර්ථය ලබා ඉන්පසු ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ විශාල ඉංජිනේරු ආයතනයක තුන් අවුරුද්දකට නොඅඩු කාලයක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති අය.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයදුම්කරුවන් යුද හමුදවට අවශ්‍ය සෞඛ්‍යතත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතුයි.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත් තම අත්අකුරින් විය යුතු අතර 1970.11.5 වැනි දින දවල් 12 ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුද මූලස්ථානය, තැ.පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත් බහාලන කවරයෙහි ''විදුලි හා යාන්ත්‍රික නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම් පත'' යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම් පත් බාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත්කර ගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුයි. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම්පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය,

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම් කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරාපත් කර ගැනීම කරනු ලබන්නේ එසේ තෝරාගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවන්ට, එය පවත්වන ස්ථානය, දිනය හා වේලාවන් ලියා දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශෙෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍යවේ.

10. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දයක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩු කර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් දිය යුත්තේය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුද ආඥපති වෙනුවට.

1970 ඔක්තෝබර් 9 වැනි දින.

**ලංකා යුද්ධ හමුද කාර්‍ය සේවා ලංකා ඉංජිනේරු බලකායේ විදුලි හා යන්ත්‍රික නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම් පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය :————.
(ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න)

3. ලිපිනය :—
කාර්යාලයේ :————.
වාසස්ථානයේ :————.

4. උපන් දිනය :————.
70.11.5 වැනි දිනට වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ වත්මන් ලිපිනය :—
මවගේ :————.
පියාගේ :————.

6. ඔබ විවාහකද ? අවිවාහකද ? :————.

7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශෙෂ සුදුසුකම් මොනවාද :——

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහිද? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද ?:————.

12. ඔබගේ පාසැල්සමය, විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—
පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
ඇතුල්වූ දිනය :————.
අස්වූ දිනය :————.
සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණය :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—
ස්වාමි පක්ෂය :————.
රැකියාවේ ස්වභාවය :————.
සේවය කළ කාලය :———— දින සිට ————දින දක්වා.

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :—
(1) ————
(2) ————

මෙම අයදුම් පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————————
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–551—70.10.16 වැනි දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## ලංකා යුද හමුදාවේ දන්ත නිලධාරි තනතුර

1. ලංකා යුද හමුදාවේ දන්ත නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරුවන්ට ලංකා යුද හමුදා වෛද්‍ය බලකායේ කපිතාන් නිලයේ ස්ථිර අධිකාරි පත්වීම් පිරිනමනු ලැබේ.

3. (ඒ) පත්වීම ලැබීමේදී තෝරාපත් කරගනු ලබන ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ පළපුරුදුකම් අනුව පහත සඳහන් වැටුප් ක්‍රමයෙහි සුදුසු ස්ථානයක තබනු ඇත :—

(i) II වෙනි ශ්‍රේණිය—වාර්ෂික වැටුප රු. 8,160—රු. 360 වාර්ෂික වැඩිවීම් 8 සහ රු. 480 වාර්ෂික වැඩිවීම් 7—රු. 14,400.

(ii) I වන ශ්‍රේණිය—වාර්ෂික වැටුප රු. 14,880—රු. 480 වාර්ෂික වැඩිවීම් 3—රු. 16,320.

(බී) I වන සහ II ශ්‍රේණියන් නොකැඩෙන කාලසීමාවක් වනු ඇත.

(සී) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

(i) රු. 180ක මාසික සේවා දීමනාවක්,

(ii) **වෙන්වීමේ දීමනා.**—(1) නොකඩවා දින 14කට නොවැඩි කාල සීමාවකට සාමාන්‍ය රාජකාරි සඳහා '' තුල වාසය '' කිරීමට නියෝග කරනු ලබන විවාහක නිලධාරීන්ට '' තුල වාසයට '' දිනකට රු. 1.50 බැගින්,

(2) නොකඩවා දින 14කට වැඩි කාලසීමාවකට හදිසි නීතිය හෝ විශේෂ රාජකාරින් සඳහා '' තුල වාසය '' කිරීමට නියෝග කරනු ලබන විවාහක නිලධාරීන්ට '' තුල වාසයට '' දිනකට රු. 2 බැගින්,

(iii) **ගමන් වියදම්.**—රජය විසින් රජයේ නිලධාරීන්ට ගමන් හා සංයුක්ත දිමනා ගෙවනු ලබන පරිදි,

(iv) **සුදුසුකම් දීමනා.**—යුද හමුදා වෛද්‍ය හා දන්ත නිලධාරීන්ගේ රෙගුලාසි අනුව සුදුසුකම් දීමනා,

(v) ඒකාබද්ධ වැටුපට විවාහක දීමනාද ගෙවනු ලැබේ.

(vi) 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයේ නියම කර ඇති පරිදි අනිකුත් දීමනා (ඇඳුම්, පැලඳුම් නිල ඇඳුම්, නඩත්තු හා මෙහෙකරු දීමනා) ගෙවනු ලැබේ.

(ඩී) 1961 සැප්තැම්බර මස 25 වෙනි දින අංක 12,673 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධනය කරන ලද 1961 යුද හමුදා වෛද්‍ය හා දන්ත නිලධාරීන්ගේ රෙගුලාසි යුද හමුදා දන්ත නිලධාරීන් කෙරෙහි බලපවත්වනු ඇත. 1961 යුද හමුදා වෛද්‍ය හා දන්ත නිලධාරීන්ගේ රෙගුලාසිවලට පටහැනි නොවන අනිකුත් සියළුම රෙගුලාසි යුද හමුදා දන්ත නිලධාරීන්ට අදාල වනු ඇත.

4. තෝරා පත් කරගනු ලබන ඉල්ලුම්කරුවන් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට සුදුස්සන් වනු ඇත. එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයන් ගණන් බැලීමේ පදනම, ආණ්ඩුවේ ගැසට් පත්‍ර නිවේදනය මගින් විටින් විට සංශෝධනය කරනු ලබන, 1934 පෙබරවාරි මස 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධාන අනුව වනු ඇත. වැඩි විස්තර කොළඹ, යුද හමුදා මූලස්ථානය වෙතින් ලබාගත හැක.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(ඒ) ජාතිය—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(බී) ඉල්ලුම්කරුවන්ගේ වයස 1970.11.5 දිනට අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය.

(සී) අධ්‍යාපනික සුදුසුකම්—අපේක්ෂකයන් ඇල්.ඩී.ඇස්., බී.ඩී.ඇස්. හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ පරික්ෂණ මණ්ඩලයකින් ලබාගත් දන්ත සුදුසුකමක් සහ අතිරේකව ලංකා වෛද්‍ය ආයතන යේ දන්ත ශල්‍ය නිලධාරියෙකු වශයෙන් ලියාපදිංචි වී සිටිය යුතුයි.

1970 වර්ෂයේ අවසාන පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ටද ඉල්ලුම් කළ හැක.

(ඩී) ඉල්ලුම්කරුවන් විසින් නියමිත වෛද්‍ය අවශ්‍යතාවයන් සපුරා ලිය යුතු අතර, ඔවුන් තෝරා පත්කර ගැනීමට ප්‍රථම, යුද හමුදා බලධාරීන් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

6. ඉල්ලුම්කරුවන් පහත දක්වා ඇති ආකෘති පත්‍රයෙහි නියම කර ඇති පරිදි පිළියෙල කර 1970.11.5 දින හෝ ඊට පෙර ලැබෙන සේ, යුද හමුදා මූලස්ථානය, තැපැල් පෙට්ටිය 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත බහා ලන කවරයෙහි '' දන්ත නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත '' යනුවෙන් සඳහන් කළ යුතුය.

7. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම් පත්, සෙබඅ්‍ය සේවා අධිකාරි මගින් ඉදිරිපත් කළයුතු අතර යම්කිසි නිලධාරියෙක් තෝරා පත් කරගනු ලැබුවහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත් රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

8. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම්පතට අමුණා එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය,

(බී) තමා ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහතිකය සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය, සහ

(සී) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්. මෙම සහතික පත් ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා හඳුනන වගකිවයුතු පුද්ගලයන් ගෙන් මෑතකදී ලබාගත් ඒවා විය යුතුය.

9. ලැබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව ගැන සලකා බලා අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරින් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත්කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරාගත් ඉල්ලුම් කරුවන්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගන්නා ඉල්ලුම්කරුවන්ට එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාව ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹදී පැවැත්වෙන අතර ඒ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බැව් දන්වනු ඇත.

10. තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරුවන් විසින්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවෙහි යෙදීමට සහ විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරබයා දැනටමත් පනවා ඇති හෝ මීට පසුව පනවනු ලැබිය හැකි නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

11. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේය.

12. තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරුවන් අවශ්‍ය වුවහොත් ලංකාවේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය.

13. ඉල්ලුම් පත් පහත නියම කර පරිදි පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥාපති වෙනුවට.

1970 ඔක්තෝබර් මස 9 වැනි දින.

### ලංකා යුද හමුදාවේ වෛද්‍ය බලකායේ දන්ත නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ජාතිය :————.

(ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද ? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න.)

3. ලිපිනය—

කාර්යාලයේ :————.

වාසස්ථානයේ :————.

4. උපන් දිනය :————.

1970.11.5 වැනි දිනට වයස—අවු. :————. මාස :——. දින :——

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ දැන් ලිපිනය—

මවගේ :————.

පියාගේ :————.

6. ඔබ විවාහකද ? අවිවාහකද ? :————.

7. ඔබ පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබාගෙන ඇති ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබාගෙන ඇති වෙනත් ක්‍රියාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බලසේනාවේ හෝ නිත්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11. ඔබ මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහිද ? එසේනම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? :————.

12. ඔබගේ පාසැල් සමය හෝ විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :

| පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය | ඇතුලුවූ දිනය | අස්වූ දිනය | සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණය |
|---|---|---|---|
| | | | |

13. පාසැලින් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්තව සිටි රැකියාවන් පිළිබඳව පහත සඳහන් විස්තර සපයන්න :

| ස්වාමි පක්ෂය | රැකියාවේ ස්වභාවය | සේවය කළ කාලය— ......දින සිට | ......දින දක්වා |
|---|---|---|---|
| | | | |

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම් පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–547—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## ලංකා යුද්ධ හමුදවේ නීති නිලධාරි තනතුර

ලංකා යුද්ධ හමුදවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කරගනු ලබන අපේක්ෂකයා ලංකා යුද්ධ හමුදවේ තාවකාලික මේජර් නිලයෙහි ස්ථිර අධිකාරි පත්වීමක් පිරිනමනු අතර ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකායට ඇතුළත් කරනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරුට පහත දක්වා ඇති පරිදි නිලයට අනුකූලවූ වැටුප් හා දීමනා ගෙවනු ලැබේ :—

කපිතන් —වාර්ෂික වැටුප —රු. 9,240—8 × 180—රු. 10,680
(මාසික වැටුප —රු. 770—8 × 15—රු. 890)

මේජර් —වාර්ෂික වැටුප —රු. 11,400—8 × 240—රු. 13,320
(මාසික වැටුප —රු. 950—8 × 20—රු. 1,110)

ලුතිනන් කර්නල්—වාර්ෂික වැටුප —රු. 15,000—7 × 360—රු. 17,520
(මාසික වැටුප —රු. 1,250—7 × 30—රු. 1,460)

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

**විවාහක නිලධාරින්ගේ දීමනාව**

මසකට රු. 750 හා රු. 775 ට අඩු —මසකට රු. 97.50
මසකට රු. 775 හා ඉන් ඉහළ —මසකට රු. 100.00

**වෙනත් දීමනා**

(i) මූලික නිල ඇඳුම් දීමනාව.—රු. 1,000.

(ii) නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව.—මසකට රු. 25.00

(iii) අනුගාමික දීමනාව.—විවාහක නිලධාරීන්ට හා පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00ක්

(iv) වෙන්ව සිටීමේ දීමනාව—

(i) සාමාන්‍ය රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට දින 14කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්

(ii) හදිසි හා විශේෂ රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14කට වැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගින්

(v) ගමන් හා ඒකාබද්ධ දීමනා.—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ඇ) නිලධාරීන්ගේ වැටුප් මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුද වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වන දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද්ධ හමුද මූලස්ථානයෙන් ලබාගත හැක.

4. අයදුම්කරුවන් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(අ) ජාතිය.—අපේක්ෂකයන් ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) වයස.—අපේක්ෂකයන් 1970.11.5 වැනි දින වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්—අපේක්ෂකයන් අද්වකාත්වරුන් හෝ ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරුවරුන් විය යුතු අතර නීතිඥ මණ්ඩලයේ සාමාජිකයෙක් සේ අඩු වශයෙන් අවුරුදු 4ක කාර්‍යයෙහි යෙදී සිටි පළපුරුද්දක් ඇති අය විය යුතුය.

(ඈ) සෞඛ්‍ය තත්ත්වය.—යුද්ධ හමුදවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වයක් අපේක්ෂකයන්ට තිබිය යුතුය.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත් තම–අත් අකුරින් විය යුතු අතර, 1970.11.5 වැනි දින දවල් 12 ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුද මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පත් බහාලන කවරයේ " යුද්ධ හමුදවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත " යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. රාජකීය ලංකා නාවික හමුදව හා රාජකීය ලංකා ගුවන් හමුදව ඇතුළත්, රජයේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත්කරගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම්පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතික,

(ඇ) අඩුගනනේ චරිත සහතික පත් දෙකක්. මෙම සහතික පත්, ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන් ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත්කරගැනීම කරනු ලබන්නේ එසේ තෝරාගත් ඉල්ලුම් කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩල යක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගන්නා ඉල්ලුම්කරුවනට එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. තෝරා පත්කරගනු ලබන අයදුම්කරු හමුද පුහුණුවක් ලබාගැනීමට හා මොනයම් හමුද ඒකකයක රීති සම්බන්ධ කටයුතු කිරීමට බැඳී සිටිය යුතු අතර දිවයිනේ මොනයම් පළාතක වුවත් සේවය කිරීමට සූදනම්ව සිටිය යුතුය.

11. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දයක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේය.

12. නීති නිලධාරි තනතුර සම්බන්ධයෙන් 1969 දෙසැම්බර් මස 12 දින අංක 14,844 දරණ ගැසට් පත්‍රයේ පලකර ඇති නිවේදනය මෙයින් අවලංගු කෙරේ. මෙම නිවේදනය අනුව ඉල්ලුම්පත් කර ඇති අයදුම්කරුවන් නැවත ඉල්ලුම් කළයුතු වේ.

එම්. ඒ. ජයවීර,  
බ්‍රිගේඩියර්,  
යුද හමුද ආඥපති වෙනුවට.

1970 ඔක්තෝබර් මස 9 වැනි දින.

**ලංකා යුද්ධ හමුදවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ජාතිය (ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද ? නැතහොත් ලියාපදිංචි කිරිමෙන්ද ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න) :————.
3. ලිපිනය—  
   කායසීලයේ :————.  
   වාසස්ථානයේ :————.
4. උපන් දිනය :————.  
   1970.11.5 වැනි දිනට වයස :—  
   අවුරුදු :————. මාස :————. දින :————.
5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ දැන් ලිපිනය :—  
   මවගේ :————.  
   පියාගේ :————.
6. ඔබ විවාහකද ? අවිවාහකද ? :————.
7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.
8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.
9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බලසේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? :————.
10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද :——
11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? :————.
12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—  
    පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.  
    ඇතුළත්වූ දිනය :————.  
    අස්වූ දිනය :————.  
    සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණ :————.
13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—  
    ස්වාමි පක්ෂය :————.  
    රැකියාවේ ස්වභාවය :————.  
    සේවය කළ කාලය ————දින සිට————දින දක්වා
14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.  
    ————.  
    ————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,  
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–548—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර උඳුරව කෝරල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කලාගම් පළාත කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධූරය**

නැගෙනහිර උඳුරව කෝරල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම් කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායසීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කායසීල, ග්‍රාමීය උසාවි, තැපැල් කායසීල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිඛ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිඛ ස්ථාන සහ කායසීලවල ප්‍රදර්ශනය කර ඇති දන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායසීලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 නොවැම්බර් මස 26 වෙනි දින හෝ එදිනට ප්‍රථම මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අ. පූ. බ. මනම්පේරි,  
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් මස 5 වෙනි දින,  
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කායසීලයේ දීය.

10–486—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ පෙරියකල්ලාර් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මන්මුනේ දකුණ හා එරුවිල් පෝරතිවු පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය**

පෙරියකල්ලාර් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචි වී සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කායසීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කායසීල, ග්‍රාමසේවක කායසීල, පළාත් පාලන ආයතන කායසීල, ග්‍රාමීය උසාවි, තැපැල් කායසීල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායසීලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කායසීලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 නොවැම්බර් 20 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ටී. බාලසන්දිරන්,  
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (අතිරේක).

1970 ඔක්තෝබර් මස 2 වෙනි දින,  
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායසීලයේ දීය.

10–468—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

ඒ.ඒ 74/එක්ස්. 2287/70.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්‍ෂ තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලංකා උසස් කාර්මික ආයතනයේ අධ්‍යක්‍ෂ තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ඔක්තෝබර් මස 30 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 නොවැම්බර් මස 5 වැනිදා.

**සටහන් :** (i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූ ද, තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්‍ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැ යි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර සථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය : රු. 22,440—2 × 900—රු. 24,240 (ඒකාබද්ධ).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.10.30 වැනිදා තමන්ගේ වයස අවුරුදු 35ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(සී) ඉංජිනේරු විෂයයන්ගෙන්, උසස් ශාස්ත්‍රීය හා පශ්චාත් උපාධිධාරියෙකු හෝ වෘත්තීය සුදුසුකම් හා උපාධිධරයෙකු වීමෙන් පසු අවුරුදු 12 කට අඩු නොවන කාලයක් රජයේ සේවයේ මාණ්ඩලික තනතුරක සේවාවක් තිබිය යුතුයි. විශ්ව විද්‍යාල හෝ සම තත්ත්වයේ ආයතනයක ඉගැන්වීමේ යටත් පිරිසෙයින් 5 අවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුයි.

(ඩී) සිංහලෙන් වැඩ කිරීමට හැකියාවක් තිබීම හෝ පත්වීම ලැබ අවුරුදු 3ක් ඇතුළත සිංහලෙන් වැඩ කිරීමට හැකියාවක් ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්‍ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ.යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

10-601—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### නැටුම් හා මුද්‍රානාට්‍ය විද්‍යාලය — උඩරට හා පහත රට නැටුම් පිළිබඳ සහකාර කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති, රජයේ නාට්‍ය හා මුද්‍රානාට්‍ය විද්‍යාලයේ උඩරට හා පහත රට නැටුම් පිළිබඳ සහකාර කථිකාචාර්ය තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකික පුරවැසියන්ගෙන් (ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම) ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත් ලේඛනගත තැපෑලෙන් 1970.11.11 දිනට හෝ ඊට පෙර හෝ කොළඹ 2, මැල්ලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම්, (පාසල් පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. වර්ෂයකට රු. 5,016 — 11 × 144 සහ 5 × 180 — 7,500 යන ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් වේ. වර්ෂයකට රු. 6,780 ඒකාබද්ධ වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමකින් සමත් විය යුතුය.

(1969.10.1 දිනට පෙර පැවති මෙයට අනුරූප වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 2,580 — 11 × 120 සහ 5 × 180 — 4,800) විවාහක දීමනා නියමිත ප්‍රමාණයකට අනුව ගෙවනු ලැබේ.

3. **වයස් සීමාව.**—1970.11.11 දිනට වයස අවුරුදු 25 කට නො අඩු විය යුතු අතර අවුරුදු 45 කට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

4. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය, හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් 6කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ

(iii) ඊට සම හෝ උසස් විභාගයකින් සමත් ව සිටිය යුතුය.

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ඊට සමාන විද්‍යායතනයක පෙරදිග නාට්‍ය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමා උපාධියක්, හෝ

(ii) ශ්‍රී ලංකා ජාතික කලායතනයේ/රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාල යේ උඩරට නැටුම්/පහත රට නැටුම් පිළිබඳ 6 අවුරුදු සහතිකය හෝ

(iii) ලංකා ගාන්ධර්ව සභාවේ/රජයේ නැටුම් විභාගයේ නැටුම් පිළිබඳ අවසාන සහතිකය, සහ

(ඉ) ඉහත (ආ) ඡෙදයේ සඳහන් සුදුසුකම් ලැබීමෙන් පසු උඩරට නැටුම් හා/හෝ පහත රට නැටුම් උගැන්වීමේ 5 අවුරුද්දක පළපුරුද්ද හා සිංහල භාෂාවෙන් උගැන්වීමට හා වාර්තා තැබීමට හැකියාව තිබීම.

සටහන.—(1) ඉහත (අ) දක්වා ඇති සුදුසුකම් නොමැතිව වුවද, අවුරුදු 10 කට නො අඩු පළපුරුද්දක් ඇති ප්‍රසිද්ධ නැටුම් ශිල්පීන් ගැන ද සලකා බලනවා ඇත.

(2) දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට ඉහත (අ) යටතේ සුදුසුකම් නැතිව මුත් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය සමඟ අනිකුත් සුදුසුකම් ඇත්නම් ඒ අය ගැන ද සලකා බලනවා ඇත.

(3) එහෙත් ඉහත 1 හා 2 සටහන් අනුව සුදුසුකම් ලබා පත්වීම් ලබන අය පත්වීම් ලබා අවුරුදු 3ක් ඇතුළතදී (අ) (ii) යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය.

5. **බඳවා ගැනීමේ කොන්දේසි :**

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත් කරන ලද පිරිමි අපේක්ෂකයන් විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් තනතුරක් දරණ නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවුරුදු එකක කාල සීමාවක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1959 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද තෝරා පත් කර ගනු ලැබූවන් අනුකූල විය යුතුය.

(iv) බඳවාගැනීමේ කොන්දේසි පිළිබඳව, 1969.6.9 දිනැති අංක 765 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 වන ඡෙදයේ (අ) සහ (ආ) අදාළ වේ.

6. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් දිනයට පසුව එවන අයදුම් පත් භාර ගනු නො ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානින්ට නියම අවස්ථාවේ **ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.**

7. අයදුම් කරුවන් විසින් පහත දක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය. (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුලත් වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවලට අනුකූලව නිකුත් කළ උප්පැන්න සහතිකය භාර ගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික.

(ඇ) අයදුම්කරුවන්ගේ චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික තුනක්. මින් එකක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම සේවක තැනගෙන් ලබාගත් එකක් විය යුතුය.
(සැ.යු.—දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

8. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් ලියකියවිලි මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන් දේසි ද බලනු මැනවි.

10. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය පසු වී ලැබෙන ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

11. තැපැලේ දී සිදුවිය හැකි කවර හෝ ප්‍රමාදයක් මග හැරවීම සඳහා සිය ඉල්ලුම් පත් කල් වේලා ඇතිව ලියා පදිංචි තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

පී. උඩගම,
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂජනරාල්.

1970 ඔක්තෝබර් මස 10 වෙනි දින,
කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දිය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ උඩරට හා පහතරට නැටුම් පිළිබඳ සහකාර කථිකාචාර්ය තනතුරු

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
2. තැපැල් ලිපිනය :————.
3. ස්ත්‍රී පුරුෂ භාවය :————.
4. විවාහක ද අවිවාහක ද යන බව :————.
5. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද (ආ) ලියාපදිංචි වීමෙන්ද යන්න සඳහන් කරන්න. (ලංකාවේ පුරවැසියෙකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න).
6. (අ) උපන් දිනය :————.
(ආ) 1970.11.11 දිනට නියම වයස :—අවු :——— මාස :——— දින :—
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න).
7. උපන් ස්ථානය :
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා:————.
(ඇ) අයදුම්කරුගේ මව :————.
8. අධ්‍යාපන සුදුසුකම් (අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග): —
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
9. අන්තිමට ඉගෙන ගත් පාසලෙන් අස් වූ දිනය :————.
10. පාසලෙන් අස් වූ දින සිට කරන ලද රැකියා සම්බන්ධව විස්තර :—

| දෙපාර්තමේන්තු | දැරූ තනතුරු | සේවා කාලය සිට | සේවා කාලය දක්වා |
|---|---|---|---|

11. නැටුම් පිළිබඳ ලබා ඇති සහතික :————.
(නිකුත් කළ ආයතනයේ නම සඳහන් කරන්න).
12. නැටුම් පිළිබඳ විශේෂ නිපුනත්වය ලබා ඇත්තේ කවර අංශයකින්ද ?
:————.
13. නව නිර්මාණ සම්බන්ධව ඇති හැකියාව පිළිබිඹු කිරීමට ඇති සාක්ෂි :
————.
14. මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුනු විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි බව සොයාගනු ලැබුවහොත් තේරීමට කලින්, මා නුසුදුසු වීමටත්, පත්වීමෙන් පසු, එම ප්‍රමාද දෝෂය අනාවරණ වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත් බව දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

10-614—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## මහවැලි සංවර්ධන මණ්ඩලය

### ඉංජිනේරු තනතුරු

මහවැලි සංවර්ධන මණ්ඩල සේවයේ පහත දැක්වෙන තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම් පත්‍රය මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ තැ. පෙ. 1667, මහවැලි සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය. අයදුම්පත් සභාපති වෙත මිස මණ්ඩලයේ සේවයේ කිසිම නිලධාරි යෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

(අ) මෙරට ඉල්ලුම්පත්—30. 10. 1970.
(ආ) විදේශීය ඉල්ලුම්පත්—7. 11. 1970.
**(1) සහකාර සාමාන්‍යාධිකාරි තනතුරු 1 (ඉංජිනේරු අංශය)**

**වැටුප් ක්‍රමය.**—මසකට රු. 1,800—50—2,000 සියලු දීමනා සහිතව.
(i) **වයස.**—අවුරුදු 50 කට නොවැඩි,

(ii) සුදුසුකම් :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු උපාධියක් සහ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය සහ

(ආ) සුදුසුකම් ලත් ඉංජිනේරුවකු වශයෙන් අවුරුදු 15 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතු අතර, අඩු ම වශයෙන් ඉන් අවුරුදු 5 ක් සිවිල් ඉංජිනේරු යෝජනා ක්‍රමයක සැලසුම් සහ නිර්මාණ කටයුතු සම්බන්ධව විය යුතුය. තවද, අඩු වශයෙන් අවුරුදු 3 ක අධිකාරි ඉංජිනේරු තත්ත්වයේ පරිපාලන වැඩ ගැන පළපුරුද්දක් තිබිය යුතුය.

(2) ප්‍රධාන ඉංජිනේරු තනතුර

වැටුප් ක්‍රමය.—මසකට රු. 1,750—50—1,950 (සියළු දීමනා සහිතව).

(i) වයස.—අවුරුදු 50 කට නොවැඩි,

(ii) සුදුසුකම් :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු උපාධියක් සහ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය සහ

(ආ) සුදුසුකම් ලත් ඉංජිනේරුවකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතු අතර, අඩුම වශයෙන් ඉන් අවුරුදු 5 ක් විධායක තත්ත්වයේ විය යුතුය.

(3) ඉංජිනේරු තනතුරු—1 වැනි ශ්‍රේණිය—(සිවිල්—යාන්ත්‍රික—විදුලි)

වැටුප් ක්‍රමය.—මසකට රු. 1,600—50—1,800 (සියළු දීමනා ඇතුළුව)

(i) වයස.—අවුරුදු 50 කට නොවැඩි,

(ii) සුදුසුකම් :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් සහ/හෝ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය සහ

(ආ) ඉංජිනේරු වැඩ සම්බන්ධ සැලසුම් සහ/හෝ නිර්මාණ කටයුතු පිළිබඳව අඩුම වශයෙන් අවුරුදු 5 පළපුරුද්ද.

(4) ඉංජිනේරු තනතුරු—II වැනි ශ්‍රේණියේ—(සිවිල්—යාන්ත්‍රික—විදුලි)

වැටුප් ක්‍රමය.—මසකට රු. 1,200—50—1,600 (සියළු දීමනා ඇතුළුව)

(i) වයස.—අවුරුදු 50 ට නොවැඩි,

(ii) සුදුසුකම් :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් සහ/හෝ පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය.

(ආ) ඉංජිනේරු වැඩ සම්බන්ධ සැලසුම් සහ/හෝ නිර්මාන කටයුතු පිළිබඳව හෝ විදුලි සහ යාන්ත්‍රික යන්ත්‍ර සැලසුම් කිරීම, පිහිටුවීම සහ යථා තත්ත්වයේ තබා ගැනීම සම්බන්ධ අඩුම වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්ද.

(5) ඉංජිනේරු තනතුරු—III වැනි ශ්‍රේණිය—(සිවිල්—යාන්ත්‍රික—විදුලි)

වැටුප් ක්‍රමය.—මසකට රු. 800—40—1,120 (සියළු දීමනා ඇතුළුව).

(i) සුදුසුකම්.—පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් හෝ සමාන වෘත්තීය සුදුසුකම්.

බඳවා ගැනීමේ කොන්දේසි :

(i) තව අවුරුදු 2 කට දිගු කිරීමට හැකියාවක් ඇතිව අවුරුදු 2 ක කාලයක කොන්ත්‍රාත්තුවක් මත පත්වීම් දෙනු ලැබේ.

(ii) තෝරාගනු ලබන ආධුනිකයන් මණ්ඩලයේ සේවකයන් සඳහා පිහිටුවිය හැකි අර්ථසාධක අරමුදලට දායකයෙකු විය යුතුය.

(iii) තෝරාගනු ලබන ආධුනිකයන් හයමසක පරීක්ෂා සේවා කාලය කට යටත් වන අතර, රජයේ භාෂා ප්‍රතිපත්ති අනුකූලව ක්‍රියා කළ යුතුය.

(iv) තෝරාගනු ලබන ආධුනිකයන්, පත්වීම බාර ගැනීමට ප්‍රථම ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

## මහවැලි සංවර්ධන මණ්ඩලය

### අයදුම්පත

1. ඉල්ලුම් කරන තනතුර :————.
2. නම :————
3. ලිපිනය :————.
4. වයස :————.
5. විවාහකද/අවිවාහකද :————.
6. දැනට කරන රැකියාව :————.
   සියළු දීමනා සහිත වැටුප :————.
7. සුදුසුකම් (අධ්‍යාපනික සහ වෘත්තීය) :————.
   (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුය.)
8. සිංහල ප්‍රවීණතාවය :————.
9. විශේෂ දක්ෂතාවය :————.
10. චරිත සහතිකපත් දී ඇති අයගේ නම් සහ ලිපිනයන් :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන :

(1) අඩුවශයෙන් එක සහතිකයක් වත් දැනට සේවය කරන ස්ථානයේ සේවා යෝජකයාගෙන් විය යුතුය. රජයේ හෝ සංස්ථාවල සේවය කරනු ලබන අය ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුත්තේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ සභාපති/සාමාන්‍යාධිකාරි මගිනි.

(2) ඉල්ලුම්පත්‍රය ලැබුණු බව දැන්විය යුතුනම්, ලිපිනය සඳහන් තැපැල් පතක් ඉල්ලුම්පත සමග එවිය යුතුය.

(3) අයදුම්පත් කැඳවා නොමැති තනතුරු සඳහා එවනු ලබන අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10–579—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ විශේෂ අරමුදල් යෝජනා ක්‍රමයක් වන දියතලාවේ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය

### 1971 පෙබරවාරි මස ආරම්භ වන ශාස්ත්‍රාලීය වර්ෂය

දියතලාවේ මැනීම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ, මැනීම හා සිතියම් ගත කිරීම පිළිබඳ එක් අවුරුදු නේවාසික පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීමේ ඉල්ලුම් පත් 1970 නොවැම්බර් මස 16 වෙනි දින තෙක් පහත සඳහන් අය විසින් භාරගනු ලැබේ :—

නාරාහේන්පිට, කිරුළ පාරේ, සර්වේ ජනරාල් කාර්යාලයේ අභ්‍යාස ආයතන අංශය ; යාපනය, වව්නියාව, අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, කුරුණෑගල, පුත්තලම, මහනුවර, බදුල්ල, මඩකලපුව, රත්නපුරය හෝ ගාල්ල ප්‍රාදේශීය මැනුම් කාර්යාල ; දියතලාවේ මැනීමේ හා සිතියම් ගත කිරීමේ ආයතනයේ සම කලමනාකාර තැන.

ඉහත දැක්වෙන ස්ථානවලින් ලබාගත හැකි ආකෘති පත්‍රවල ඉල්ලුම් කළ යුතු වේ. එහි රු. 1ක් වටිනාකම ඇති මුද්දර අලවා, විධි වූ පරිදි අත්සන් කොට ඒවා අවලංගු කළ යුතුය. කුමන අන්දමකින් හෝ දෝෂ වන ඉල්ලුම්පත්‍ර භාර ගනු නොලැබේ.

වැඩි විස්තර අවශ්‍ය නම්, දියතලාවේ, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ සම කලමනාකාර තැනගෙන් ලබාගත හැක.

දැනටමත් රජයේ සේවයේ හෝ රජයට අයත් සංස්ථාවක හෝ මණ්ඩලයක හෝ සේවය කරන අයදුම්කරුවන් විසින්, පහත දෙවන ඡේදයේ සඳහන් සුදුසුකම් ලබා ඇත්නම්, ඔහු මෙම පාඨමාලාවට තෝරා ගනු ලැබුවහොත් එක් වර්ෂයක පූර්ණ වේතන සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට හැකි වන බවට තම දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ හෝ මණ්ඩලයේ ප්‍රධානියාගේ සහතිකයක්ද සමග ඔහු මඟින්ම තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි.

2. යෝග්‍යතාවය.—මෙම පාඨමාලාව සඳහා අයදුම්කරුවන් :

(අ) ලාංකිකයන් විය යුතුය. එනම් පාරම්පරික ලෙස හෝ ලියාපදිංචි කිරීමෙනි.

(ආ) පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුය :—

(i) (අ) ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක් හා භෞතික විද්‍යාව සඳහා සාමාර්ථයක් ද සමග ජ්‍යෙෂ්ඨ පාඨ ශාලා සහතිකය **හෝ**

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් පහත දැක්වෙන පරිදි අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් 6 ක්,

එනම් (i) සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ සාමාර්ථයක්, (ii) ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක්, (iii) භෞතික විද්‍යාව සඳහා සාමාර්ථයක් සහ (iv) වෙනත් විෂයයන් 3කින් සාමාර්ථයන්, **සහ**

(ii) (අ) කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික ආයතනයේ හෝ, කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක හෝ, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ මැනුම් අභ්‍යාස විද්‍යාලය විසින් මෙහෙයවන ලද මැනීමේ හා තලමිතිය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන දිවා පාඨමාලාව හෝ, තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව **හෝ** සම්පූර්ණ කිරීමේ සහතිකය, **හෝ**

(ආ) ඊට සමාන කාර්මික සුදුසුකම්.

3. **සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—4 වෙනි ඡේදයේ සඳහන් ලිඛිත විභාගයට පෙර පහත දැක්වෙන ලියකියවිලි (මුල් පිටපත්) ඉදිරිපත් කළ යුතු වේ :—

(අ) 2 (ආ) (ii) (අ) ඡේදයේ සඳහන් ආයතනවලින් ඕනෑම එකක විදුහල්පති විසින් අත්සන් තබන ලද චරිතය පිළිබඳ සහතිකයක්.

(ආ) අයදුම්කරුගේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනේ සහතික කරන ලද පිටපතක්.

(ඇ) ලංකා පුරවැසියන් වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ පුරවැසි භාවය ලැබීමට ඇති හිමිකම් පිළිගත් බව දක්වන මූලික නිල ලිපි (අදාළ පරිදි).

(ඈ) 2 (ආ) ඡේදයේ දැක්වෙන සුදුසුකම් පිළිබඳ සහතික. මූලික සහතික පත්‍රය තවම ලැබී නොමැතිනම් ආයතනයේ විදුහල් පතිගෙන් ලත් ලිපියක් භාර ගනු ලැබේ.

4. **ඇතුළත් කිරීම.**—අවශ්‍ය සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගණිතය, භෞතික විද්‍යාව, සාමාන්‍ය දැනීම, බුද්ධිය, මැනුම් හා තලමිති ශිල්පය සහ සැලැස්ම ශිල්පයද පිළිබඳව ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

සුදුසු අයදුම්කරුවනට එම පරීක්ෂණය පිළිබඳව, ස්ථානය, දිනය සහ වේලාව පසුව දන්වනු ලැබේ. ඉන්පසුව සුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජන කොට අවසාන තෝරා ගැනීම කරනු ලැබේ.

තදනන්තරව, මෙම පාඨමාලාවට ඇතුළුවීම, රජයේ වෛද්‍යවරයකු විසින් කරනු ලබන නියමිත වෛද්‍ය පරීක්ෂණයකින් අයදුම්කරු සමත් වීම මතද රඳා පවතී. මෙම වෛද්‍ය පරීක්ෂණයේ ප්‍රතිඵල, අභ්‍යාස පන්තිය පටන් ගැනීමට පෙර දියතලාවේ මැනීමේ හා සිතියම් ගත කිරීමේ ආයතනයේ සම කළමනාකරු වෙත ඉදිරිපත් කළ යුතුයි. වැඩ කටයුතු කිරීමේ ලා ප්‍රමාණවත් උද්‍යෝගයක් හෝ උපදෙස් අනුගමනය කිරීමට හැකියාවක් හෝ නො දක්වන ශිෂ්‍යයින් නිසි පරිදි අවවාද කිරීමෙන් පසුව ඉවත් කර දැමීමට ද ඉඩ ඇත.

ඇතුලත් කිරීම සම්බන්ධයෙන් හෝ ඉවත් කරවීමේදී හෝ සර්වේ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

5. **ඉගැන්වීමේ මාධ්‍යය.**—දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, ඉල්ලූ විටෙකදී, සිංහල සහ දෙමළ විස්තර පත්‍රිකා දේශන පැවැත්වීමට පෙර ලබාගත හැක.

6. **ඉඩ පහසුකම්.**—අවිවාහකයන් සඳහා වූ ඉඩ පහසුකම් (අවශ්‍ය ගාහභාණ්ඩ දෙක තුනක්ද ඇතුළුව) හා පොදු මුළුතැන් ගෙයක්ද ශිෂ්‍යයනට සපයනු ලැබේ.

7. **ගාස්තු හා තැන්පත්.**—ඉගැන්වීමේ හෝ පුස්තකාල ගාස්තු හෝ අයකරනු නොලැබේ. ඇතුලත් වූවන් විසින් කැඩුම් බිඳුම් ආදිය සඳහා ආපසු ගෙවනු ලබන රු. 30 තැන්පත් කිරීමක් සැපයීම අවශ්‍ය වන්නේ ය.

8. **ඩිප්ලෝමා.**—උසස් කාර්මික මට්ටමක් දක්වා පාඨමාලා මෙහෙයවනු ලැබේ. සමත් වනු ලබන අයදුම්කරුවනට මැනීම පිළිබඳව ඩිප්ලෝමා උපාධියක් පිරිනමනු ලැබේ.

දෙපාර්තමේන්තුව විසින් රැකියාවක් සැපයීම පිළිබඳ සහතික කිරීමක් මෙම ඩිප්ලෝමා උපාධියෙන් ප්‍රකාශ කිරීමක් හෝ ඇඟවීමක් සිදු නො කෙරේ.

කෙසේ නමුදු, මැනුම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු ඇතිවිටදී හෝ ඇතිවන විටදී බඳවා ගනු ලබන්නන් ආයතනයේ ඩිප්ලෝමා උපාධි දරන්නවුන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, තෝරා ගනු ලැබේ. සර්වේ ජනරාල් විසින් තව දුරටත් විභාග කිරීමක් සිදු නොකොට, ඔහුගේ අභිමතය පරිදි සම්මත ආධුනික කාලයක් සතුටුදායක ලෙස සම්පූර්ණ කළ ඩිප්ලෝමා උපාධිධාරීන්ට මැනීමේ හා තලමිතිය පිළිබඳ අවසර පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

සී. වන්නියසිංගම්,
වැ. බ. සර්වේ ජනරාල්.

1970 ඔක්තෝබර් මස 9 වෙනි දින,
කොළඹ 5, තැ. පෙ. 506,
මැනුම් දෙපාර්තමේන්තුවේ,
අභ්‍යාස ආයතන අංශයේදී ය.

10–581—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### වාණිජ විද්‍යා සහතික පත්‍ර විභාගය සිංහල/දෙමළ—1970

පූර්වොක්ත විභාගය 1970 දෙසැම්බර් මස 19 වැනි දින ආරම්භවේ. අයදුම්පත් බාරගන්නා අවසාන දිනය 1970 නොවැම්බර් 5 වැනිදා වේ.

මුද්‍රිත අයදුම්පත් හා ව්‍යවස්ථා 1970 නොවැම්බර් මස 2 වැනි දින දක්වා තැපැල් මගින් ලබාගත හැක. තැපැල් මගින් අයදුම්පත් ඉල්ලා එවීමේදී තම නම සහ ලිපිනය ලියනලද (මුද්දර නොගැසූ) 9 1/2"×4 1/2" ප්‍රමාණයේ ලියුම්කවරයක් එවීම අවශ්‍යය. "ජේ 13" යන්න එහි වම්පස උඩ කෙළවරේ සඳහන් කළයුතුය. මෙවැනි ලියුම් කවර නොඑවා මෙම අයදුම්පත් තැපෑලෙන් ලබාගත නොහැකි බැව් විශේෂයෙන් සැලකියයුතුය.

මෙම අයදුම්පත් 1970.10.26 දින සිට 1970.11.4 වැනි දින දක්වා මෙම කාර්‍යාලයට පැමිණීමෙන් ද ලබාගත හැක.

ජේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1970 ඔක්තෝබර් 8 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදීය.

10–598—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## 1970 අප්‍රේල් මස පවත්වන ලද නොතාරිස් අවසාන විභාගය

මෙහි පහත නම සඳහන් අයදුම්කරු ඔහුගේ නමට ඉදිරියෙන් පෙන්නුම් කරන භාෂාවෙන් නොතාරිස් වෘත්තියේ කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන විභාගයෙන් සමත් වී සිටින බව මෙයින් දනුම් දෙනු ලැබේ:—

එච්. පී. පී. බණ්ඩා—සිංහල.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 13 දින,
කොළඹ දීය.

10–515—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය. |
|---|---|
| 1. මෙරට සෑදූ සුදු කපු ඇඳරෙදි (බෙඩ් කවර්) සැපයීම. ... | 1970.11.3 |
| 2. පොටවල් 4රේ ගෝනි නූල් සැපයීම. | 1970.11.24 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970. 10. 16 දින,
කොළඹදීය.

10–594—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ජාතික කිරි මණ්ඩලය

**1971 වර්ෂය සඳහා බඩු නිෂ්කාශනය කොට ඉදිරිපත් කිරීම**

1971 ජනවාරි මස 1 දින සිට 1971 දෙසැම්බර් මස 31 දින දක්වා වූ කාලය සඳහා වාප්පුවෙන් බඩු නිෂ්කාශනය කොට ඉදිරිපත් කිරීම සඳහා මවිසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තුවක්/සංස්ථාවක් සඳහා බඩු නිෂ්කාශනය හා ඉදිරිපත් කර, යටත් පිරිසෙයින් 5ක් අවුරුද්දක පළපුරුද්දක් ටෙන්ඩර්කරුවන්ට තිබිය යුතුය.

**ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—1970 නොවැම්බර් මස 4 බදාදා අ. භා. 2 දක්වා.

**ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන අවසාන දිනය.**—1970 නොවැම්බර් මස 3 දින අ. භා. 3 දක්වා.

ආපසු ලබාගත හැකි රු. 250 තැන්පත් මුදලක්ද ආපසු ලබාගත නොහැකි රු. 25 ක ටෙන්ඩර් ගාස්තුවක්ද ගෙවීමෙන් ටෙන්ඩර් පත්‍රිකා නාරාහේන්පිට කිරි මණ්ඩල කාර්යාලයේ සැපයුම් කළමනාකරුගෙන් ලබාගත හැක.

සභාපති.
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
33, එළිබැන්ක් පාර,
කොළඹ 5.

10–587—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ටයර් සංස්ථාව

**1971 වර්ෂය සඳහා දින දර්ශන මුද්‍රණයකර සැපයීම**

ඉහත සඳහන් කරුණ පිළිබඳව සීල් තබන ලද ටෙන්ඩර් වර්ෂ 1970 ක් වූ ඔක්තෝබර් මස 21 වෙනි දින පෙරවරු 10.30 දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ ලිතෝ මුද්‍රණ කටයුතු සඳහා පහසුකම් ඇති මුද්‍රණකරුවන්ගෙන් පමණි.

චිත්‍ර සටහන, වර්ණ විස්තර හෝ මෙතෙක් උවමනා විස්තර මෙම සංස්ථාවේ සැපයුම් කොට්ඨාශයෙන් වැඩකරන කාලය තුළ දී පරීක්ෂා කොට විස්තර ලබාගත හැක.

සැපයුම් කළමනාකරු.

ලංකා ටයර් සංස්ථාව,
තැ. පෙ. 8, කැළණිය.
දුරකථන: **241, 274, 305 කැළණිය.**

10–590—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

**කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම**

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1971 ජනවාරි 1 වන ද සිට 1972 දෙසැම්බර් 31 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් වලින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරිමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර පත්‍ර ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය..

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත"ට කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහු ගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවනට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩර්යක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතු යි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරණ විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයෙහි සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර කරුවන් විසින් සැළකිය යුතුය.

13. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1970 ඔක්තෝබර් 8 වෙනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| 1 | | 2 | 3 | 4 | 5 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් | | | | | | | |
| | | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | රු. | රු. | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| 1. අත්තනකඩවල ග්‍රා. රෝ. | ... | 100... | 300 | | 276... | 275... | 275... | 1,120... | 300... | 320... | 310... | 1,250 |
| 2. බි. ඕ. පී. 400 ග්‍රා. රෝ. | ... | 100... | 500 | | 400... | 400... | 400... | 1,600 | 1,100... | 1,120... | 1,100... | 4,325 |
| 3. යටවත්ත මා. නි. | ... | 100... | 400 | | 180... | 175... | 175... | 700 | 460... | 450... | 450... | 1,775 |
| 4. ගිරිතලේ මා. නි. | ... | 100... | 400 | 70.11.16 | 235... | 100... | 450... | 875 | 650... | 260... | 1,200... | 2,400 |
| 5. මනම්පිටිය මා. නි. | ... | 100... | 300 | වැනි දින | 90... | — ... | 120... | 400 | 225... | — ... | 300... | 1,050 |
| 6. උතුරු මාතලේ මා. නි. | ... | 100... | 400 | පෙරවරු | 85... | 90... | 90... | 360 | 575... | 575... | 550... | 2,175 |
| 7. ඔවිල්කන්ද මා. නි. | ... | 100... | 400 | 10ට | 325... | 320... | 320... | 1,270 | 475... | 460... | 460... | 1,800 |
| 8. ඉලුක්කුඹුර මා. නි. | ... | 100... | 400 | | 275... | 275... | 550... | 90 | 160... | 140... | 300... | 475 |
| 9. දේවහුව මා. නි. | ... | 100... | 400 | | 250... | 250... | 250... | 950 | 450... | 475... | 460... | 1,790 |
| 10. මැදිරිගිරිය රෝහල | ... | 100... | 800 | | 500... | — ... | 1,000... | 1,000 | 500... | — ... | 1,000... | 2,000 |

10–602—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

**අරක්කු සහ වෙනත් දේ ප්‍රවාහනය සඳහා ටෙන්ඩර්, කළුතර—1970-71**

1970 නොවැම්බර් මස 1 වන දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ :—

(i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි සුරාබදු ගුදම් සහ දුම්රිය බඩු ගබඩා ද, කළුතර දිස්ත්‍රික්කය තුළ හා පිටත පිහිටි ස්කාගාරද,

(ii) කළුතර දිස්ත්‍රික්කය තුළ හා දිවයිනේ වෙනත් පෙදෙස්වල පිහිටි ගුදම් අතරද.

අරක්කු හා වෙනත් දේ එහා මෙහා ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, 1 වන මහලේ පිහිටි සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ඔක්තෝබර් මස 28 වන දින පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

රුපියල් 100 ක මුදලක් සුරාබදු දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරි යක හෝ තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සුරාබදු කොමසාරිස් වෙතින් ඉල්ලුම් කළ විට ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක මෙම ටෙන්ඩර් සකස් කළ යුතු අතර, මේ පිළිබඳ අවශ්‍ය සියලුම විස්තර සුරාබදු කොමසාරිස්ගෙන් නොමිළයේ ලබා ගත හැකිය. ටෙන්ඩර් පත්‍ර 1970 ඔක්තෝබර් 26 වන දින දහවල් 12 න් පසුව නිකුත් කරනු නොලැබේ.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970 ඔක්තෝබර් මස 8 වන දින,
කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ,
1 වැනි මහලේ පිහිටි,
සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දීය.
එල් බී/ඊ/437.

10–528—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 නොවැම්බර් මස 11 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| බින්තැන්න ප්‍රා. ආ. නි. කොටසේ සොරබොර ජනපද පාර වැඩිදියුණු කිරීම. | රුපියල් 25,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට 1970 ඔක්තෝබර් මස 31 වැනි දින පස්වරු 3 තෙක් බදුල්ලේ කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදාළ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1970 නොවැම්බර් මස 11 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, පෙරෙව්වූ පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ලේ දිසාපති ගෙන් දැනගත හැකිය.

ජී. සී. දිසානායක,
උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල,
1970 ඔක්තෝබර් මස 5 වැනි දින.

10–523—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් "සර්විස් පිට් ලැම්ප් ෆිටිංගේස්" සැපයීම සහ වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා 1970 නොවැම්බර් 16 වැනි දින පෙ. ව. 10 වන තෙක් සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර නියමිත පෝර්ම කොළ වල ලියා අනු පිටපතකින් ද යුක්ත කොට එවිය යුතුයි. එම පෝර්ම කොළ ටෙන්ඩර් විවෘත කරන ඉහත සඳහන් දිනට පෙර දින දවල් 12 වනතෙක් පහත සඳහන් මගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. මෙම පෝර්ම ලබා ගැනීමට කොළඹ 5, කිරුළ පාරේ අංක 200 වෙනි ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ටෙන්ඩර් සඳහා මුදලින් රුපියල් 100 ක් තැන්පත් කොට, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

1970 ඔක්තෝබර් මස 9 වන දින,
සම්පාදක අංශය,
වේරහැර,
බොරලැස්ගමුව.

10–561—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

සල්fපියුරික් ඇසිඩ් සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර කොළඹ 5, කිරුල පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 දෙසැම්බර් මස 16 වැනි බදාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර නියමිත පෝර්මවල ලියා අනු පිටපතකින් යුක්ත කොට එවිය යුතුයි. එම පෝර්ම කොල මගේ කාර්යාලයෙන් 1970 දෙසැම්බර් මස 15 වෙනි අඟහරුවාදා ප. ව. 3 වන තෙක් ලබා ගත හැක. ඒවා නිකුත් කරනු ලබන්නේ බොරලැස්ගමුවේ, වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන ගිනුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කොට ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් දැන ගත හැක.

වැඩ බලන ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

වේරහැර,
බොරලැස්ගමුව.

10–584—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

මගේ අංකය: කෝ සී 8/63.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රජයේ බෙහෙත් ගබඩාව

### හිස් භාජන විකිණීම

පහත සඳහන් හිස් භාජන විකිණීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි විසින් 70.10.30 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

| ද්‍රව්‍ය අංක | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | ගැලුම් 45 හිස් පෙරු වයින් ස්ප්‍රිතු පිප්ප මූඩි සමග ... | 151 |
| 2. | ගැලුම් 45 හිස් තෙල් පීප්ප මූඩි සමග ... | 49 |
| 3. | ගැලුම් 45 හිස් තෙල් පීප්ප මූඩි රහිත ... | 53 |
| 4. | ගැලුම් 5 හිස් ටින් ... ... ... | 100 |
| 5. | වර්ග නොකල ටින් තොග ... ... | 1 |

2. ඉහත සඳහන් හිස් භාජන බොරැල්ල ප්‍රාන්සිස් පාරේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ දී පෙර පෝය දිනයන් හෝ පෝය දින යන් හැර සතියේ වැඩකරන දිනයන්හි පෙ. ව. 9 සිට ප. ව. 4.30 දක්වා පරීක්ෂාකර බැලීමට පුළුවන.

3. ටෙන්ඩර්කරු විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව මුද්‍රා තබන කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම් පස උඩ කෙලවරේ "හිස් භාජන විකිණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

4. මරදාන, ඩීන්ස් පාරේ අංක 355 දරණ ස්ථානයේ රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත රුපියල් 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩරයට අමුනා එවිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ඉහත සඳහන් පළමු ඡේදයේ සඳහන් දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. මෙම දැන්වීමේ ඇති සෑම කොන්දේසියකට නොපිළි පැද තිබුණොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

6. කිසිම ප්‍රශ්නයක නොමැතිව ටෙන්ඩර් සමහරක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් භාරගැනීමේ හෝ අයිතිය රජය සතුය. මෙම දැන්වීමේ ඇති සෑම කොන්දේසියක්ම නොපිළි පැද තිබුනොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

7. තෝරුණු ටෙන්ඩර්කරු පිළිගත් බව දන්වා දින 7ක් ඇතු ලත දී එම විෂයයන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මිල ගණන් සම්පූර්ණයෙන්ම බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත ගෙවිය යුතුය. එලෙස මුදල් ගෙවා දින තුනක් ඇතුලත දී මේ විෂය භාරගෙන රජයේ බෙහෙත් ගබඩාවේ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

8. ඉහත සඳහන් 7 වන ඡේදයේ සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ.

9. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මරදාන ඩීන්ස් පාරේ අංක 355 දරන ස්ථානයේ පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරිගෙන් ලබා ගත හැක.

ඩී. ඒ. ඒ. මුණසිංහ,
රජයේ බෙහෙත් ගබඩා අධිකාරි.

1970. 10. 5 වන දා,
කොළඹ, රජයේ බෙහෙත් ගබඩා කාර්යාලයේ දීය.

10–483—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## රබර් ප්‍රවාහණය සඳහා මිළ ගණන් කැඳවීම

1970 නොවැම්බර් 1 වැනිදා සිට 1971 සැප්තැම්බර් 30 වැනි දින දක්වාවූ කාල සීමාව තුළ කොළඹ 15, මට්ටක්කුලිය, පර්ගියුසන් පාරේ අංක 346 දරණ ස්ථානයේ පිහිටි රජයේ මධ්‍යම රබර් ගබඩාවේ සිට කොළඹ වරාය ලොරිවලින් ශීට් රබර් මිටි ප්‍රවාහණය කිරීම සඳහා ලියාපදිංචි ප්‍රවාහණ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිළ ගණන් වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස් විසින් (තැ. පෙ. අංක 147, කොළඹ) භාරගනු ලැබේ.

2. වාප්පුවේදී, නැව්වලට රබර් පටවනු ලබන විට දෙපාර්තමේන්තු මය වාහන නොමැති අවස්ථාවලදී ප්‍රවාහණ සේවය අවශ්‍යවනු ඇත. ඒ හෙයින්, මෙම සේවාව නිරන්තරයෙන්ම අවශ්‍ය නොවිය හැකිය. කෙටි කාලීන දැන්වීමකින් දිවා රාත්‍රී තුල මෙම සේවාව භාරගැනීමට තෝරාගත් ටෙන්ඩර්කරු සූදානමින් සිටිය යුතුය.

3. සම්පූර්ණ කාල සීමාව හෝ ඉන් කොටසක් සඳහා හෝ කිසියම් මිල ගණනක් හෝ සියළුම මිල ගණන් හෝ ප්‍රතික්ෂේප කිරීම සහ මිල ගණනක යම්කිසි කොටසක් පිළිගැනීම හෝ 1971.9.30 වැනි දිනට කලින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හෝ වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස් වෙත පැවරී ඇති අවිවාදාත්මක අයිතියකි.

4. වාප්පුවල රබර් මිටි ප්‍රවාහණය කිරීම සඳහා රාත්තල් 250හේ එක මිටියකට අයකරන ප්‍රවාහණ ගාස්තුව සහ ප්‍රමාද කිරීමේ ගාස්තු වෙතොත්, ඒ සඳහා අයකරන ගාස්තුවද ඇතුලත් මිළ ගණන්, පිටපත් දෙකකින් යුක්තව 1970 ඔක්තෝබර් මස 28 වැනි දින පෙ. ව. 11 ට පෙර වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්ට ලැබෙන ලෙස ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ "රබර් ප්‍රවාහණය සඳහා මිළ ගණන්" යනුවෙන් සඳහන් කළ යුතුය.

5. බඩු ප්‍රවාහණය කරන අතර මගදී ප්‍රේෂණයට යම් අලාභයක් හෝ හානියක් සිදුවුවහොත් ඒ සඳහා වන්දි ඉල්ලීමේ වගකීමට තෝරාගත් අයදුම්කරු බැඳී සිටියි.

6. තෝරාගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුවකට බැඳීමට සිදු වන අතරම රුපියල් 2,500ක ඇප තැන්පත් මුදලක් තැබීමද අවශ්‍ය වනු ඇත. එම සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීමෙන් පසුව පමණක් එම මුදල ආපසු ගෙවනු ලැබේ.

7. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යොදවනු ලබන යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙක් වෙනුවෙන් හෝ 1934 අංක 19 දරණ කම්කරු වන්දි මුදල් ආඥාපනත හෝ එහි ව්‍යවස්ථානුකූල සංශෝධන, ලිහිල් කිරීම්, එකතුකිරීම් යන කිසිවක් හෝ යටතේ ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් හෝ වන්දි ඉල්ලීමක් හෝ වෙතොත් කොන්ත්‍රාත්තුකරු විසින් ඒ හැම දෙයකින්ම ආණ්ඩුව මුදාගත යුතුය.

8. මෙම සේවාව ඉටුකිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතුය. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීම අහිතකරයයි සලකණු ලැබුවහොත් ඔහු සේවයේ යොදවා ගැනීමට විරුද්ධවීමේ අයිතිය වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස් සතුවන අතර එවැනි සේවකයින්ගේ සේවය නතර කිරීමට තෝරාගත් ටෙන්ඩර්කරු විසින් වහාම පියවර ගතයුතුය.

9. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් කොන්ත්‍රාත්තුවේ මුළු කාල සීමාව සඳහා තම වාහන වෙනුවෙන් සම්පූර්ණ රක්ෂණ වගකීම් ලබාගත යුතුය.

10. කොලඹ 1, ඕස්ට්‍රේලියා ගොඩනැගිල්ලේ 4 වැනි මාලයේ පිහිටි වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්ගේ කාර්යාලයෙන් වැඩිපුර විස්තර ලබා ගත හැකිය.

වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්.

1970 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 1,
වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේදීය.

10–415—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා තුනීලැලි සංයුක්ත මණ්ඩලය

### වාප්පුවේ සිට බඩු නිෂ්කාශනය කොට සංයුක්ත මණ්ඩලයේ ආයතනවලට යැවීම

වාප්පුවේ සිට බඩු නිෂ්කාශනය කොට මෙම සංයුක්ත මණ්ඩල යට අයත් ආයතනවලට යැවීම සඳහා සීල් තැබූ ටැන්ඩර්පත් ලංකා තුනීලැලි සංයුක්ත මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 ඔක්තෝබර් මස 30 වැනි දින ප. ව. 3 දක්වා භාරගනු ලැබේ. මෙය අවුරුද්දක කාල සීමාවක් සඳහා පමණී. ටැන්ඩර්පත් භාරගනු ලබන්නේ වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයේ සහ රේගුවේද රේගු ඒජන්තවරුන් වශයෙන් ලියාපදිංචි වූවන්ගෙන් පමණකි. සේවා පිළිබඳ සියලු විස්තර මෙම ටැන්ඩරයට අදාල ටැන්ඩර් පෝර්මයේ දක්වා ඇත.

ටැන්ඩර් පෝරම හා අදාල කොන්දේසි, ආපසු ගෙවනු ලබන රු. 500 ක මුදලක් හා ආපසු නොගෙවනු ලබන රු. 10 ක ටැන්ඩර් ගාස්තුවක්ද මෙම කාර්යාලයේ තැන්පත් කිරීමෙන් සැපයුම් නිලධාරීගෙන් (විදේශ) ලබාගත හැකිය.

සභාපති,
ලංකා තුනීලැලි සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. අංක 1148,
420, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

10–431—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—හක්වටුනා ඔය උප කොට්ඨාසය

වයඹ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනා ඔය උප කොට්ඨාශය යටතේ, බඩු ප්‍රවාහනය කිරීම සඳහා 1970 නොවැම්බර් මස 10 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිතිවලට, මෙම වැඩය සඳහා ඉල්ලුම් කළ හැක. හක්වටුනා ඔය උප කොට්ඨාශයේ වාරිමාර්ග කාර්යාලයෙන් හෝ කුරුණෑගල, නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයෙන්, ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව, ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ, වාරිමාර්ග අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ හක්වටුනා ඔය, කුරුණෑගල, නිකවැරටිය, වාරිමාර්ග කාර්යාලයේ, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 25 ක් (විසිපහක්) තැන්පත්කොට ඒ වෙනුවෙන් ලබාගත් මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 නොවැම්බර් 5 වැනි දින පස්වරු 1 දක්වා ලබාගත හැක.

3. 1970 නොවැම්බර් මස 10 වැනි අඟහරුවාදා පෙරවරු 10 ට කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

4. ටෙන්ඩර් කොන්දේසි ඇතුළත් වැඩි විස්තර හක්වටුනා ඔය උප කොට්ඨාශයේ වාරිමාර්ග කාර්යාලයෙන් ලබගත හැක.

සී. අප්පදොරේ,
උප කොට්ඨාශ භාර නිලධාරි,
හක්වටුනා ඔය උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
මකුල්පොත,
1970 ඔක්තෝබර් මස 5 වැනි දින.

10–522—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1970/71 මුදල් වර්‍ෂයේ 1 වන භාගය තුල, පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි යටතේ ඇති ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි ඉදි කිරීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම**

පොළොන්නරුව, මඩකලපුව සහ මාතලේ දිස්ත්‍රික්කයන් තුල පිහිටි පහත සඳහන් කායර්‍යාංශවලට පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1970.10.26 වැනි දින පෙරවරු 10 දක්වා පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරී විසින් මිළ ගණන් භාර ගනු ලැබේ :—

**පොළොන්නරුව දිස්ත්‍රික්කය :** බිබියාවැව, කවුඩුල්ල පියවර 1, කවුඩුල්ල පියවර 2, අඹගස්වැව, බැදිවැව, ගල්අමුණ, පිඹුරත්තෑව, බී. ඕ. පී. 649 ;

**මඩකලපුව දිස්ත්‍රික්කය :** කිරිමච්චෝඩෙයි, මුරුතන්කර්ණි ;

**මාතලේ දිස්ත්‍රික්කය :** වැවලවැව.

(i) 6″ × 9″ කළුගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතු.

(ii) 2″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතු.

(iii) $1\frac{1}{2}$″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතු.

(iv) 1″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතුය.

(v) $\frac{3}{4}$″ කැටගල් (කියුබ් ගණනින්)—ගල්වළ ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතු.

(vi) ගංවැලි (කියුබ් ගණනින්)—සපයන ස්ථානය ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතුයි.

(vii) පිලිස්සූ ගඩොල් (1,000 බැගින්)—(පිළිගත් ප්‍රමාණය $8\frac{1}{4}$″ × $4\frac{1}{2}$″ × $2\frac{3}{4}$″) පෝරණුව ව්‍යාපාරයේ සිට සැ. 10 ඇතුලත වියයුතුය.

(viii) වියාපු පොල්අතු (1,000 බැගින්).

(ix) අළුහුණු (බුසල් ගණනින්)—ගෝනි සමඟ.

(x) තම්බාපු හුණු (බුසල් ගණනින්)—ගෝනි සමඟ.

2. සැපැයීම පිළිබඳ මිළ ගණන් වෙන් වෙන් වශයෙන් දැක්විය යුතුයි :—

(අ) පෝරණුවේදී/ගල්වලේදී (ලොරි යා හැකි ස්ථාන විය යුතුයි.)

(ආ) කායර්‍යාංශයට ගෙනවිත් භාරදීම.

3. ඒ ඒ ව්‍යාපාරයට වෙන වෙනම රුපියල් 50 බැගින් මෙම කායර්‍යාලයේ හෝ ඕනෑම දිසාපති කායර්‍යාලයක තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් අනුමත ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුයි. 1970.10.25 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. මෙම කායර්‍යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝරමවල ඉල්ලුම් කළ යුතු අතර, ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1970.10.26 වෙනි දින පෙරවරු 10 ට පෙර මෙම කායර්‍යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැම්ම හෝ ඉඩම් සංවර්ධන නිලධාරි, පොළොන්නරුව යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් හෝ එවීම කළ හැකිය. ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සැපැයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතු ය.

5. 1970.10.26 වැනි දින පෙරවරු 10.30 ට පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරිගේ කායර්‍යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටිය හැකිය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඇණවුම් කළ විට, ඔහු විසින් සති දෙකක් ඇතුලත දී ද්‍රව්‍ය භාරදිය යුතුය. යමෙකුට එසේ කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ නම කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් වන්නේ ය.

7. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලු ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය, ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ අයිතිය හා විශේෂ අනුකූල නොවූ සැපැයීම් ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

8. තවද, වැඩි විස්තර පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි ගෙන් ලබාගත හැකිය.

සී. වී. ධම්සිරි,
ඉඩම් සංවර්ධන නිලධාරි, පොළොන්නරුව.

1970 සැප්තැම්බර් 30 දින,
පොළොන්නරුව ඉ. සං. නි. කායර්‍යාලයේ දීය.

10–423—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය]

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දෙපාර්තමේන්තුවට අයත් ප්‍රවාහණ අංශයේ ඇති පාවිච්චි කළ මෝටර් රථ කොටස් සහ කොළඹ 8, සර්පන්ටයින් පාරේ පිහිටි දෙපාර්තමේන්තුවට අයත් මුළුතැන්ගෙයිහි ඇති පාවිච්චි කළ මුළුතැන්ගෙයි උපකරණ මිලදී ඉවත් කරගෙනයාමට කැමැති අයවලුන්ගෙන් ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 නොවැම්බර් මස 4 දින අ. භා. 2.30 දක්වා බාරගනු ලැබේ.

කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් භා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1970 නොවැම්බර් මස 4 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනිමට පිළිවන.

ආර්. ඇෆ්. සී. ද ලිවේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 10. 5 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ල,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

10–497—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත්, කොළඹ ආයතනයන්ට 1971. 3. 31 න් අවසන් වන කාලය තුළ කුකුල් මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 නොවැම්බර් මස 2 දින අ. භා. 2.30 වන තෙක් බාරගනු ලැබේ. කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබා ගත් බව කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1970 නොවැම්බර් මස 2 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීම් කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පිළිවන.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 10. 4 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ,
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ල,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

10–498—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 නොවැම්බර් මස 9 වැනි සඳුදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| | | |
|---|---|---|
| රත්නපුර අධ්‍යාපන **කාර්යාලය** | ... | ගොඩනැගිල්ලේ සහ ජල නල සේවයේ හදිසි අළුත් වැඩියාව සහ වැඩි දියුණුව |

**සංලක්ෂ්‍යය.**—ර=රත්නපුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල් වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 නොවැම්බර් මස 7 වැනි සෙනසුරාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති.) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේදී කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

අවශ්‍ය ලියාපදිංචිය රු. 8,000.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිති වලටද මේ වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් තැබීමෙන් නිදහස්ය. ඔවුන් දෙවන ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂ ගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය පිළිබඳ විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරී වෙත භාර දිය යුතුය. එසේ බාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1970 නොවැම්බර් මස 9 දා ප. ව. 2 ට රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වනතුරු තමන් සඳහන් කරන මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන් හෝ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. හේරත්,
රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂ.

1970 ඔක්තෝබර් මස 6 වැනි දින,
රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

10–519—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදුලි බල මණ්ඩලය

### යටිබහන් සැපයීම

ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකාර තැන වෙත යටිබහන් සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර වර්ෂ 1971 ක්වූ ජනවාරි මස 20 වන බදාදා පූ. භා. 10 දක්වා ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් ලංකා මුදලින් රුපියල් 50 ක් ටෙන්ඩර් ගාස්තුව වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සිය කොන්ත්‍රාත් හා සැපයීම් භාර ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම රුපියල් පනහ (50) ක් මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබා ගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්ෂ 1971 ක්වූ ජනවාරි මස 15 වන දින ප. ව. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1971 ක්වූ ජනවාරි මස 20 වන බදාදා පූ. භා. 10 ට කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඩබ්ලිව්. ඊ. ද. ආබෘ,
ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන
කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1970 ක්වූ ඔක්තෝබර් 16 වෙනි දින දීය.

10–442—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 නොවැම්බර් මස 11 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි සවභාවය | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
| --- | --- |
| යටිකිඳ ප්‍රා. ආ. නි. කොට්ඨාසේ, හැගොඩ අංදෙණිය ජලනල යෝජනා ක්‍රමය තැනීම ... | 75,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචිවී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට 1970 ඔක්තෝබර් මස 31 වැනි දින පස්වරු 3 තෙක් බදුල්ලේ කච්චේරියේදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදාළ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ආණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1970 නොවැම්බර් මස 11 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙන යම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ලේ දිසාපතිගෙන් දැනගත හැකිය.

ජී. සී. දිසානායක,
උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල,
1970 ඔක්තෝබර් මස 2 වැනි දින.

10-472—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

ඩීසල් යාන්ත්‍රික බස් චැසි සැපයීම සඳහා නිපදවන්නන් සහ නිෂ්පාදන අයිතිකරුවන් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1970.11.10 වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

වැඩිමනත් විස්තර මගේ කායර්ාලයෙන් ලබාගත හැක.

වැඩ බලන ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.
ලංකා ගමනාගමන මංඩලය.

වේරහැර,
බොරලැස්ගමුව,
1970 සැප්තැම්බර් මස 30 වන දින.

10-537—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

මණ්ඩලය මගින් දෙසතියකට වරක් නිකුත් කරන ගමනාගමන පුවත් පත ඉදිරි වර්ෂයට මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1970 ඔක්තෝබර් මස 27 වෙනිදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනු පිටපතකින් ද යුක්ත කොට එවිය යුතුයි. මෙම පෝර්ම පත් වේරහැර බොරලැස්ගමුවේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරිතැනගේ කාර්යාලයෙන් 1970 ඔක්තෝබර් මස 26 වැනිදා දවල් 12 වන තෙක් ලබා ගත හැකිය. පෝර්ම පත් ලබා ගැනීමට වේරහැර, බොරලැස්ගමුවේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන ගිණුම් නිලධාරීතැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කර, ඒ වෙනුවෙන් ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරිතැන.
ලංකා ගමනා ගමන මංඩලය.

වේරහැර,
බොරලැස්ගමුව,
1970 ඔක්තෝබර් 5 වන දින.

10-541—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### බඩු ප්‍රවාහනය කිරීම

(i) රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේ සිට මරදාන තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවටත්, (ii) දුම්රිය පොළ, රේගුව හා විදුලි සංදේශ ගබඩාව අතරේ බඩු ප්‍රවාහනය කිරීමත්, (iii) කොළඹ හා සැතපුම් 15ක් අවට පෙදෙස්වල බඩු ප්‍රවාහනය කිරීම හා (iv) දෙපාර්තමේන්තු කාර්යාල මාරු කිරීමේදී, ඒවාට අදාළ ප්‍රවාහන කටයුතු කිරීම සඳහාත්, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 10 වනතෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1970 ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

4. කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුළුවේ රු. 50ක මුදලක් තැන්පත් කර පිසිට් පත්‍රයක් ලබාගෙන, එම පිසිට් පත ඉදිරිපත් කළ විට අවශ්‍ය ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. 1970 ඔක්තෝබර් 16 වැනි දින සිට 1970 ඔක්තෝබර් 30 වැනි දින පස්වරු 4.30 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබාගත හැක.

එම්. පී. ද සිල්වා,
සහකාර පෝස්ට්මාස්ටර් ජනරාල් (තැපැල් සේවා).

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

10–603—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## බිත්ති ඔර්ලෝසු සැපයීමේ ටෙන්ඩරය—පියවූ දිනය—70.7.14 දින

| සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|
| 1. දින අටක් ක්‍රියා කරන කායසීල බිත්ති ඔර්ලෝසු බ්‍රෙසලය සමග (මූනත වීදුරුව) වේලාව නොවදින. මූනත ප්‍රමාණය අඟල් 8 සිට 10 දක්වා හෝ ඊට කිට්ටු ප්‍රමාණයේ ආනයනය කරන ලද | 3 යි ... | විමලධර්ම සහෝදරයෝ, මල්වත්ත පාර, කොළඹ | රු. 170 එකක් |

10–586/1—70.10.16 දින අංක14,928 දරන ගැසට් පත්‍රය

## මෙරට සෑදූ පිරිමි පාපැදි සැපයීමේ ටෙන්ඩරය—පියවූ දිනය—1970.7.7 දින

| සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|
| 2. මෙරට නිපදවන ලද පිරිමින්ගේ පාපැදි, රාමුව අඟල් 22 සැම එකක්ම 28'' × 1½'' ටයර්වලට සුදුසු රෝද සහිත තෙල් පෝච්චිය, ආයුධ සහිත ආයුධ මල්ල, ස්ටෑන්ඩ් එක සහ ලගේජ් කැරියරය, හුලං පොම්පය, සීනුව, ගියර් කේස් එක සමග සම්පූර්ණ | 3 යි ... | සී/ස. ඊ. බී. ක්‍රිසි සහ සමාගම, 55 රජින වීදිය, කොළඹ | රු. 297.50 එකක් |

10–586/2—70.10.16 දින අංක14,928 දරන ගැසට් පත්‍රය

## මෙරට සෑදූ කැරම් ලෑලි සහ දම් ලෑලි සැපයීමේ ටෙන්ඩරය—පියවූ දිනය—1970.3.24 දින

| සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|
| 3. (1) කැරම් ලෑලි, සාමාන්‍ය මෝස්තරයේ පැත්ත අඟල් 29 ක්වූ සම චතුරශ්‍රාකාර ලී රාමුවකින් යුත් ඇතුලත පොකැට්වූ ඉත්තන් සහ ගසන පෙත්තෙන් සමන්විත | 1 යි ... | පී. ඇස්. ජේ. කුරේ මහතා, පිරිවෙන පාර, බොරලැස්ගමුව | රු. 32.45 එකක් |
| (2) දම් ලෑලි, සම්මත ප්‍රමාණයේ ලී වලින් සාදන ලද (පැත්ත අඟල් 18 ක්වූ සමචතුරශ්‍රාකාර) ඉත්තන්ද සමග | එම | එම. | රු. 9 එකක් |

10–586/3—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## ගුදිරි හා බ්‍රිස්ටල් කොහු කෙඳි සැපයීමේ ටෙන්ඩරය—පියවූ දිනය—1970.7.7 දින

| සැපයීමේ හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|
| 4. (1) හොඳට පවිත්‍රකළ සම්පූර්ණ වියළි (ලෙලි රහිත) මෙට්ටවලට සුදුසු කොහු | 2 යි | බී. ඇල්ප්‍රඩ් රණවීර, "අරම්ගිරි" නාරම්මල | රු. 16.50 හොණ්ඩරයක් |
| (2) හොඳට පවිත්‍රකළ සම්පූර්ණ වියළි ලෙලි රහිත නො. 1 වර්ගයේ පිරපු කොහු | එම | එම | රු. 38 හොන්ඩරයක් |

10–586/4—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## පිටපත් කිරීමේ ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය

| ටෙන්ඩරයේ නම | ටෙන්ඩර් කරුවන් ගණන | උප ලේඛන අංක | ද්‍රව්‍ය අංකය | ද්‍රව්‍ය විස්තරය | සාර්ථක ටෙන්ඩර්කරු | ටෙන්ඩරය පියවූ දිනය | පිළිගත් මිල |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | රු. ශ. |
| පිටපත් කිරීමේ ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය | 10 | 1 | 1 | යතුරු ලියන ඉටි කඩදසි ඉස්තරම් | මිලදී ගත්තේ නැත | 70.3.3 | — |
| | | | 2 | යතුරු ලියන ඉටි කඩදසි | සීමා/එලාම්ස් ඩුප්ලිකේටර් සමාගම වෝල්ටන් පාර වොට්ෆෝර්ඩ් හර්ට්ස් (ක්‍රවුන් ඒජන්තවරුන් මාර්ගයෙනි) | ... | 6.60 ක්වයර් එකක්. නැවතෙක් නොමිලේ මිල, වි.වි.හි.ස, ඇස්තමේන්තු කළ නැව් ගාස්තු හා රාජ්‍ය නියෝජිත මිල දී ගැනීම් කො-මිස් ඇතුලත්ව) |
| | | | 2 | යතුරු ලියන ඉටි කඩදසි සාමාන්‍ය | සීමා/ගෙස්ටෙට්නර් (ලංකා) | ... | 14.45 ක්වයර් එකක් |
| | | | 3 | අතින් ලියන ඉටි කඩදසි ... | 90, වොක්ෂෝල් විදිය,, කොළඹ 2 | ... | 15.00 ක්වයර් එකක් |
| | | | 4 | පිටපත් තීන්ත 'ගෙස්ටෙට්නර්' නිල් | ... | ... | 13.00 ටියුබයක් (වි.වි.හි.ස ඇතුලත්ව තීරු ගාස්තු රහිත) |
| | | | 6 | වැරදි මැකීමේ ද්‍රව 'ගෙස්ටෙට්නර්' | | ... | 3.25 කුප්පියක් |
| | | | 3 | අතින් ලියන ඉටි කඩදසි ... | ජෙනරල් ඉන්ඩස්ට්‍රීස්, 15, බෙලි වීථිය, කොළඹ 1 | ... | 8.95 ක්වයර් එකක් (විවිහිස ඇතුලත්ව තීරු ගාස්තු රහිත) |
| | | | 4 | පිටපත් තීන්ත 'ෂාර්ප්' නිල් | | ... | 10.50 ටියුබයක් |
| | | | 5 | පිටපත් තීන්ත 'ෂාර්ප්' කළු | ... | ... | 10.50 ටියුබයක් |
| | | | 6 | වැරදි මැකීමේ ද්‍රව අවුන්ස 1 ප්‍රමාණය | ගුන්තර් වග්නර් ෂෙලිකන් හැනෝවර්, ජර්මනිය (ක්‍රවුන් ඒජන්තවරුන් මගිනි) | ... | 1.72 කුප්පියක් (විවිහිස හා රාජ්‍ය නියෝජිත ගාස්තු ඇතුලත් තීරු ගාස්තු රහිත) |

සැ. ඩ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

10-586/5—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

**කොළඹ කෘෂිකම් ව්‍යාප්ති ආධාර අංශයේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කොළඹ කෘෂිකම් ව්‍යාප්ති ආධාර අංශයේ ප්‍රයෝජනයට ගත නොහැකි කැඩී බිඳී ගිය පහත සඳහන් භාණ්ඩ 1970 ඔක්තෝබර් මස 31 වැනි දින ප. ව. 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. කැමරා රොලිපිලෙක්ස් කවරය සමග ... 1
2. කොන්වේටර් වෝල්ට්ස් 6 ... ... 1
3. එක්ස්පෝෂර් මීටර් ... ... 1
4. ඩෙස්ක් ප්‍රිමර් අඟල් 12½ ... ... 1
5. එක්ස්පෝෂර් මීටර් (සයින්) ... ... 1
6. ගොල්ෆ් කුඩයක් ... ... 1
7. ඩාක් රූම් ලාම්පු ... ... ... 1
8. හැන්ඩ් මයික්‍රෆෝන් ... ... 1
9. ප්‍රෙස් පොර් බ්ලූ ප්‍රින්ට්ස් ... ... 1
10. ප්‍රින්ටින් බොක්ස් ... ... 1
11. අම්පිලිපයර් වොට්ස් 8 ... ... 1
12. මයික්‍රෆෝන් ... ... ... 1
13. රොලිකින් පිල්ම් බැක් ... ... 1
14. රෝලර් ස්කුවින්ජ් ... ... 1
15. ඉලෙක්ට්‍රික් ස්ටෝව් ... ... 1
16. ස්පීකර් යුනිවර්සිටි ටයිප් වොට්ස් 15 ... 1
17. ස්ක්‍රීන් 60"×40" ... ... 1
18. කැමරා ටොපිකල් (සැන්ඩර්සන්) ... 1
19. බැටරි චාජර් "පිලිප්ස්" ... ... 1
20. ස්පොට් ලයිට් ප්‍රොජෙක්ටර් ... ... 1
21. ස්කයි ලයිට් "ස්ටෑන්ඩ්" ... ... 1
22. ඊ.සී. ස්ක්‍රීන් ... ... ... 1
23. කොහොලර් ජෙනරේටර් ... ... 1
24. අම්පිලිපයර් ඉන්ඩියන් වොට් 25 ... 1
25. ලවුඩ් ස්පීකර් ඉන්ඩියන් ... ... 2
26. ලවුඩ් ස්පීකර් ට්‍රම්පට් ටයිප් ... ... 1
27. මයික්‍රෆෝන් ස්ටෑන්ඩ් සමග ... ... 1
28. මුවින් කොයිල් මයික්‍රෆෝන් ... ... 1
29. පෝටබල් ස්ක්‍රීන් ... ... 1
30. ස්ක්‍රීන් ට්‍රයිපොඩ් සමග ... ... 1
31. බෙල් ඇන්ඩ් හවල් වර්ගයේ ස්ලයිඩ් ප්‍රොජෙක්ටර් 1
32. දඹු අඹු ... ... ... 1

| | | | |
|---|---|---|---|
| 33. රෙකෝඩ් ප්ලේයර් | ... | ... | 1 |
| 34. බැටරි චාජර් ... | ... | ... | 1 |
| 35. ජෙනරේටර් කොහොලර් | ... | ... | 1 |
| 36. ස්ක්‍රීන් පෝටර්බල් හෙඩ් | ... | ... | 1 |
| 37. මයික්‍රොපෝන් ලක්ෂපාන | ... | ... | 1 |
| 38. ප්ලෑෂ් ගන් ඉලෙක්ට්‍රික් නැෂනල් | | ... | 2 |

2. 1970 ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 10 සිට 12 දක්වා, මෙම භාණ්ඩ, එම ස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැක.

3. ගැනුම්කරුවන් විසින්, තම තමන් මිලදී ගත් භාණ්ඩ එවේලේම අත්පිට මුදල් ගෙවා, එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය.

4. දැනුම් දීමක් නොමැතිව, මෙම ද්‍රව්‍යයන්ගෙන් ඕනෑම එකක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය රජය සතුය.

සී. ඊ. ෂොක්මන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 සැප්තැම්බර් මස 23 වැනි දින,
එච්ලන් චතුරශ්‍රයේ,
අංක 6 දරණ කොටසේ,
කොළඹ, කෘෂිකර්ම ව්‍යාප්ති ආධාර අංශයේදීය.

10–422—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම් කච්චේරිය

### වෙන්දේසියේ විකිණීම

1970 ඔක්තෝබර් මස් 30 දින උදේ 10 ට සිලාවතුරේ මුහුදු වෙරළේදී පහත සඳහන් ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

අංක 779 ''කිව්'' දරණ යාත්‍රාව

පැදුරු 2 යි

කොට්ට 1 යි

ලීමය කුඹගස් 2 යි

යොත් 2 යි

රුවල් කණු 1 යි

හබල් 5 යි

ලොකු කළ 2 යි

හිස් බෝතල 2 යි

බෙලෙක් උදුන් 1 යි

කුඩා බෙලෙක් පෙට්ටි 1 යි

සිලාවතුරේ මුහුදු වෙරළේ යුද්ධ හමුද කඳවුර අසලදී යාත්‍රාව පරීක්ෂා කිරීමට පුළුවන. ද්‍රව්‍යයන් ඇත්තේ සිලාවතුරේ යුද්ධ හමුද කඳවුරේ අණදෙන නිලධාරි භාරයේ ය.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති
සහ රේගු අයකැමි.

1970 ඔක්තෝබර් මස 4 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

10–493—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසි කිරීම

ත්‍රිකුණාමලය අඩවි වන නිලධාරි කාර්යාලයේ ඇති ඝන අඩි 894.3 කට සමාන හල්මිල්ල, බුරුත, පලු, මිල්ල, වැවරණ, හුලංහික්, වෙලන් ආදි වර්ගවලින් සමන්විත කඳන් 189 ක්ද, ඝ. අ. 157.2 කට සමාන හල්මිල්ල, බුරුත, වැවරණ, වෙලන්, හුලන්හික්, ආදි වර්ග වලින් සමන්විත ඉරූ ලී කෑලි 349 ක්ද, I වැනි පන්තියේ කනු 119 ක්ද, II පන්තියේ කනු 579 ක්ද, III පන්තියේ කනු 42 ක්ද, දර යාර 260 ක්ද, කම්බි කනු 20 ක්ද, ඇටඹ වර්ගයේ ඔරු 3 ක්ද, ඊටපලු 7 ක්ද, පිඟන් 3 ක්ද, ගෝනි 5 ක්ද, පිහි 5 ක්ද, හරස් කියතක්ද, හිරමන 1 ක්ද, කැන්වස් රෙදි 1 ක් සහ ලණු 5 ක්, 1970.10.31 දින පෙරවරු 9 ට, ත්‍රිකුණාමල අඩවි වන නිලධාරි කාර්යාලයේදී, ත්‍රිකුණාමලයේ දිසා වන නිලධාරී—උ. මැ. දි.—විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට පෙරාතුව, දැව ද්‍රව්‍ය පරීක්ෂා කර බලන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන් වෙන්දේසියට අදාල කොන්දේසිවලට අනුකූලතාවය දැක්විය යුතුය. වෙන්දේසිය පිළිබඳ වැඩිමනත් විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් හෝ ත්‍රිකුණාමල අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැකිය.

එච්. ආර්. පීරිස්,
දිසා වන නිලධාරි/උ. මැ. දි.

දිසා වන නිලධාරි කාර්යාලය,
ත්‍රිකුණාමලය,
1970 සැප්තැම්බර් මස 20 වන දින දීය.

10–474—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පාවිච්චියට ගත නොහැකි ශීතකරයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හෝමාගම රජයේ රෝහලට අයත් පහත දැක්වෙන ශීතකරය 1970.10.27 වැනි දින පෙරවරු 10 ට හෝමාගම රජයේ රෝහල් භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

1. භූමිතෙල් ශීතකරය (ඉලෙක්ට්‍රොලක්ස්) ආදශී LK 550.

වෙන්දේසිය අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ මුදල ගෙවිය යුතු වන අතර එම ශීතකරය වහාම රෝහල් භූමියෙන් ඉවත් කර ගත යුතුය. ඉල්ලුම් කිරීමට කැමති අයට හෝමාගම ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරිගේ අනුදැනුම ඇතිව 1970.10.24 වැනි දින සිට කායාීාල වේලාවලදී එම ශීතකරය පරීක්‍ෂාකළ හැක.

එච්. සී. ගෝමස්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි.

කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි කායාීාලය,
83, කින්සි පාර,
කොළඹ 8.

10–406—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක ඇම්බී/742 දරන නඩුවෙන් මට ලැබී තිබෙන ආඥාව පිට, කළුතර දිස්ත්‍රික්කයේ බස්නාහිර පස්දුන් කෝරලයේ ඉද්දගොඩ පත්තුවේ මීගම පිහිටි පර්චස් 13 කුත් දශම 5 ක් ප්‍රමාණ නාකන්දලගේවත්ත නොහොත් සපුතන්තිරිගේ වත්තේ ''සී'' අක්ෂරය දරන කට්ටිය 1970 ක්වූ නොවැම්බර් මස 5 වෙනි දින උදේ 10.30 ට මා විසින් එය පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ.

වැඩි විස්තර සඳහා ඩබ්ලිව්. ඩී. කුලසිරි කාලච්ල නීතිඥ මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

ඔස්ටින් ද එස්. ගුණමුණි,
උසාවියේ විකිණීම් කොමසාරිස්.

අංක 48/1,
විජේමාන්න ගොඩනැගිල්ල,
දකුණු කළුතර.

10–562—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## උගස් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

අහංගම, ගොඩයපාන ජයසුමනාරාමයේ පදිංචි රයිගම් කෝරලේ අර්මලිනා නෝනා.......................................පැමිණිලිකරු.

නො. ඇම්. බී. 1772 එදිරිව

මාතර, හිත්තටිය, මැද "සමන්" නිවසේ පදිංචි දෙන් ජේම්ස් දහනායක ..................................................... විත්තිකරු.

ඉහතකී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට විත්තිකාර පක්ෂය විසින් පැමිණිලිකාර පක්ෂයට ගෙවිය යුතු මෙම නඩු තීන්දුවේ ඉතිරි මුදල සහ පොලියද ගාස්තුවද වන රු. 2,626.88 ද යන මුදලෙන් රු. 1,500 ක් අඩුකොට ඉතිරි මුදල හා පොලිය අයකර ගැනීම පිණිස මෙහි පහත සඳහන් දේපල ප්‍රථමකොට තක්සේරු මිලට ඉල්ලුම්කරු නොසිටියේ නම් එවෙලේම මහජනයා අතරේ වර්ෂ 1970 ක්වූ නොවැම්බර් මස 12 වෙනි දින සවස 4 ට 1 වෙනි ඉඩමද සවස 4.15 ට 2 වෙනි ඉඩමද පිළිවෙලින් එම ස්ථානයන් හිදී විකුණනු ලැබේ.

(1) එනම්: දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ මාවරළ නැමති ගමේ පිහිටි ලොට් නො. 59 දරන දන්ගහ දෙනිය නැමති ගොඩ මඩ ඉඩමට මායිම්: උතුරට: ලොට් නො. 20 ඒ දරන මාවරල වත්තද; නැගෙනහිරට: ලොට් නො. 70 දරණ තිත් වෙලේ වත්ත දෙනිය සහ අම්බලම්ගාව වතුයායද; දකුණට: නො. 66 දරණ ඈවාරිගේ කුඹුර සහ ලොට් නො. 70 දරන තිත්වෙලේ වත්තද; බස්නාහිරට ලොට් නො 61 දරන වත්තගාව ලියද්ද සහ ලොට් නො. 64 දරන එගොඩහවත්තද යන මායිම් තුළ අක්කර 2, රූඩ් 1, පර්චස් 19 ක් විශාල ඉඩම සහ ගස කොළ පළතුරුවලින් නොබෙදූ හතරෙන් තුන්පංගුවක් වේ.

(2) එකී මාවරලේ පිහිටි ලොට් නො. 61 දරන වත්තගාව ලියද්ද යන ගොඩ මඩ ඉඩමට මායිම්: උතුරට සහ නැගෙනහිරට: නො. 59 දරන දන්ගහ දෙනියද; දකුණට: ලොට් නො. 59 දරන දන්ගහ දෙනිය සහ ලොට් නො. 54 දරන එගොඩහ වත්තද; බස්නාහිරට: ලොට් නො. 62 දරන පිට කොරටුව සහ නො. 64 දරන එගොඩහ වත්තද යන මායිම් තුල රූඩ් 1 කුත් පර්චස් 19 ක් විශාල ඉඩමෙන් නොබෙදූ $\frac{3}{4}$ පංගුව වේ.

**තක්සේරු මිල:** 1 වෙනි ඉඩම රු. 3,503.43 යි.
2 වෙනි ඉඩම රු. 700.50 යි.

විකිණීමේදී කියවාදෙන කොන්දේසි පරිදි වෙන්දේසි වුනි නම් තමන් ගන්නා ලද මුදලින් 1/4 ක් පංගුවක් සමග කොමසාරිස් තැනගේ සියලුම ගාස්තු ගෙවිය යුතුය. තවද කොන්දේසි ඔප්පු සහතික කිරීමේ මුද්දර ගාස්තුව සහ නොතාරිස්තැනගේ ගාස්තුද එවෙලේම ගෙවිය යුතුය. ඉතිරි මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත උසාවියට ගෙවිය යුතුයි.

මේ සම්බන්ධ වැඩි විස්තර නීතිඥ ඒ. පී. බී. සහ ඒ. පී. ඩබ්ලිව්. අබේසූරිය මහත්වරුන්ගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා සපුකොටන,
උසාවියේ කොමසාරිස්තැන සහ
තක්සේරුකාරතැන.

"කීර්ති", හිත්තටිය, මාතර,
3. 10. 1970.

**කායඹාලය:**
නො. 14, මැද පාර,
කොටුව, මාතර.

10–540—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

අංකය: විආ 3/136.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1971 ජගත් තරුණ සමුළුව—නිව්යෝර්ක්

1971 ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළ නිව්යෝර්ක් නුවරදී පැවැත්වෙන 1971 ජගත් තරුණ සමුළුවට නියෝජිතයෙකු තේරීම සඳහා රජයේ සහ අනුමත පාසැල්වල අ. පො. ස. (උ. පෙ.) පළමු වසරේ ශිෂ්‍යයන්ගෙන්ද විශ්ව විද්‍යාලයන්හි පළමු වසරේ ශිෂ්‍යයන් ගෙන් ද (ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම) අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **පරමාර්ථ හා අභිලාෂයන්.**—ප්‍රසිද්ධ සාකච්ඡා, සම්මේලන, පාසැල් සංචාර, රූප වාහිනී වැඩ සටහන් ආදිය ඇතුළත් වැඩ සටහන් වලට ක්‍රියාශීලි ලෙස සහභාගි වීමට සාමාජිකයන්ට අවස්ථාවක් සලසා දීමත්, සමුළුවට සහභාගී වන සාමාජිකයන්ගේ පෞද්ගලික බුද්ධිමය හා සංස්කෘතික පසුබිම අගය කිරීමෙහි ලා විවිධ ප්‍රේක්ෂක සමූහයනට අවස්ථාවක් ලබා දීමත්, මේ සම්මේලනයේ ප්‍රධාන අරමුණ වන්නේය. අමෙරිකානු ගෘහයක පදිංචිව සිටිමින් අමෙරිකානු අධ්‍යාපන හා ආණ්ඩු ක්‍රම නිරීක්ෂණය කිරීමටත් තමාගේ රට පිළිබඳව ප්‍රසිද්ධ සාකච්ඡාවලදී කථා පැවැත්වීමත් ලෝකයේ වෙනත් රට වලින් පැමිණෙන තරුණ නියෝජිතයින් සමග කණ්ඩායම් හා සාමූහික කටයුතුවල යෙදීමෙන් අත්දැකීම් ලබා ගැනීමටත් ඔවුනට අවස්ථාව සලසා දෙනු ඇත.

රටවල් 43 කින් නියෝජිතයින් සහභාගි වන 1971 සම්මේලනයට දීප ව්‍යාප්ත තරගයකින් තෝරාගනු ලබන එක් නියෝජිතයෙකු ලංකාව වෙනුවෙන් යැවීම අපේක්ෂා කැරේ. එක රටකින් යවනු ලබන්නේ එක් නියෝජිතයෙකු බැගින් පමණක් වන හෙයින් තෝරා ගනු ලබන්නා අවශ්‍යයෙන්ම ඒ රටේ හොඳම නියෝජිතයා විය යුතු වන්නේය. ඒ නිසා ඔහු ලංකාවේ ඉතිහාසය හා සිරිත් විරිත් ද සාමාජයීය, ආර්ථික හා සංස්කෘතික හා දේශපාලනමය කරුණුද පිළිබඳව පුළුල් අවබෝධයක් පෞද්ගලික වශයෙන් ඇත්තෙකු විය යුතුය. ඉතා චතුර ලෙස ඉංග්‍රිසි කථා කිරීමේ පුළුවන් කමක් තිබීමද අවශ්‍යය.

3. **වැඩ සටහන හා කාලය.**—1971 ජනවාරි 4 වැනි දා සිට පැවැත්වෙන හැඳින්වීමේ හා සංස්ථාපිත කිරීමේ සතියකින් ආරම්භ වන මේ සම්මේලනය 1971 මාර්තු මස අග හරියේදී අවසන් වෙයි. එකී සති කිහිපය තුළදී මෙම නියෝජිතයෝ, උසස් පාසැල් හා විශ්ව විද්‍යාලයයන් නැරඹීමට යාම, අමෙරිකානු ගෘහයක පදිංචිව සිටීම, සම්මන්ත්‍රණ හා අධ්‍යාපන යෝජනා ක්‍රමවලට සහභාගි වීම, රූප වාහිනියෙන් හා මහජන වේදිකා මත දීර්ඝ කථා පැවැත්වීම යන කාර්යයන්හි නිරත වෙති. මෙම කාර්යයන්ගෙන් වැඩි හරියක් නිව් යෝර්ක් හි මැට්රොපොලිටන් ප්‍රදේශයේ සිදු කැරෙනු ඇත. තවද, මෙම නියෝජිතයන් සඳහා වොෂිංටන් (ඩී. සී.) නගරයට සංචාරක ගමනක්ද පිළියෙල කර ඇත. මෙම නියෝජිතයින් එක්සත් ජනපදයේ නතර වී සිටින කාලය දීර්ඝ නොකරනු ඇති අතර ඔවුන් සියළු දෙනාම තම තමන්ගේ රටවලට මාර්තු මස අවසානයේදී ආපසු පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

4. **ප්‍රතිලාභයන්.**—තෝරා ගනු ලබන නියෝජිතයා සඳහා ලංකාව හා නිව්යෝර්ක් නගරය අතර ගුවන් ගමන් පහසුකම් සලසා දෙනු ලැබේ. නවාතැන් හා කෑම්බීම් අමෙරිකාවේදී ඔහුට ආගන්තුක සත්කාර සලසන ගෘහයක් මගින් සැපයෙනු ඇත.

5. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුය:—

(i) ලාංකිකයෙකු විය යුතුයි.

(ii) රජයේ හෝ අනුමත පාසැලක අ. පො. ස. (උ. පෙ.) පංතියේ ප්‍රථම වර්ෂයේ පංතියක දැනට ඉගෙනීම ලබන්නෙකු හෝ විශ්ව විද්‍යාලයක පළමු වසරේ ශිෂ්‍යයෙකු හෝ විය යුතුයි.

(iii) පංතියේ ශිෂ්‍යයින් අතරින් ඉගෙනීමේ කටයුතු අතින් මුල් හතරෙන් කොටසට ඇතුළත් අයෙකු විය යුතුයි.

(iv) 1950.9.30 හා 1954.10.1 අතර උපන් අයෙකු විය යුතුයි.

(v) අ. පො. ස. (සා. පෙ.) විභාගයේදී "අ" නිර්දේශ පත්‍රය යටතේ ඉංග්‍රිසි සඳහා යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයක් වත් ලබා සිටිය යුතුයි.

(vi) ඉංග්‍රිසි භාෂාවෙන් ලිවීමට උසස් ප්‍රවීණත්වයක් හා කථා කිරීමට උසස් චතුරත්වයක් ඇත්තෙකු විය යුතුය.

(vii) විවිධ බාහිර වැඩවල ක්‍රියාශීලීව නිරත වන්නෙකු විය යුතුයි.

(viii) ප්‍රසිද්ධ සම්මේලන, රැස්වීම්, ටෙලිවිෂන් වැඩ සටහන් හා පංති කාමර සාකච්ඡා වලට සහභාගි වීමට පුළුවන් අයෙකු විය යුතුයි.

(ix) ලෝක තතු පිළිබඳව හොඳ දැනීමක් හා සැලකිල්ලක් ද, වර්තමාන ජාත්‍යන්තර ප්‍රශ්න පිළිබඳව මනා අවබෝධයක් ද ලංකාව හා ලෝකයේ සෙසු රටවල් අතර සම්බන්ධය ගැන හොඳ අවබෝධයක් ද වෙනත් ජාතීන් වෙනත් රටවල් හා වෙනත් ජීවන විධි ගැන කුතුහලයක් ද ඇත්තෙකු විය යුතුය.

(x) විශිෂ්ඨ චරිතයක් හා විශ්වාසදායී වූ ද, වෙනත් අය සමග සහයෝගයෙන් කටයුතු කිරීමට ලැදිවූ ද වෙනත් ජාතිවලට අයත් මිනිසුන්ගේ අදහස් ආගම් හා දේශපාලන දර්ශනයන් කෙරෙහි යථා ගරුත්වයක් දක්වන්නාවූද, තමා වෙනුවෙන් අනිත් අයගේ උත්සාහයන් තේරුම් ගන්නා වූ හා අගය කරන්නා වූ ද කෙනෙකු විය යුතුය.

(xi) එක්සත් ජනපදයේ සිටියදී දුෂ්කර අධ්‍යාපන වැඩ සටහනක් බාර ගැනීමට කැමැත්ත දක්වන්නාවූද, මෙම සම්මේලනයෙන් පසුව සිය රටට පැමිණි විටදී සිය රටේ ජනතාවට සේවයක් සැලසෙන ස්වේච්ඡා යෝජනාක්‍රමයකට සහභාගි වීමට කැමැත්ත දක්වන්නා වූද, අයෙකු විය යුතුයි.

(xii) එක්සත් ජනපදයේ ගත කරන තෙමසක කාර්ය බහුල කාලය කට ඔරොත්තු දෙන විශිෂ්ඨ සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතුය.

(xiii) එක්සත් ජනපදයට යාම සඳහා ගමන් වියදම පහසුවෙන් දැරිය හැකි පවුලකට අයත් වූවකු නොවිය යුතුය.

(xiv) මීට පෙර විදේශයකට ගිය අයෙකු නොවිය යුතුය.

(xv) තෝරාගනු ලැබුවහොත් එක්සත් ජනපදයට යාම සඳහා දෙමාපියන්ගේ අවසරය ඇත්තකු විය යුතුය.

(මේ කොන්දේසි සියල්ලක්ම තෘප්ත කළ නොහැකි අපේක්ෂකයින් අයදුම් නොකළ යුතුයි.)

6. **අයදුම්පත්.**—මේ අමාත්‍යාංශයේ විදේශීය ආයතන ශාඛාවෙන් ලබා ගත යුතු විශේෂ ආකෘතියක අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු අයදුම්පත් 1970.10.26 දිනට පෙර තමා ඉගෙන ගන්නා පාඨශාලාවේ විද්‍යාලයාධිපතිට/විශ්ව විද්‍යාලයේ අදාල අංශයේ විනෙතෘවරයාට පහත සඳහන් ලියවිලි සමඟ භාර දී 1970.10.31 දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි සීඝ්‍රගාමී තැපෑලෙන් එවන ලෙස එතුමාගෙන්/එතුමියගෙන් ඉල්ලීමක් කළ යුතුය :—

විදේශ ආයතන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2.

සීඝ්‍රගාමී තැපෑලෙන් එවීම සඳහා තැපැල් වියදම අයදුම් කරු විසින් ගෙවිය යුතු යයි විද්‍යාලයාධිපති/විනෙතෘවරයා නියම කළහොත් අයදුම්කරු එම වියදම දැරිය යුතුය.

**අයදුම්පතට ඇමිණිය යුතු ලියවිලි :**

(අ) පහත සඳහන් තොරතුරු අලලා ඉංග්‍රීසියෙන් ලියන ලද වචන 700-1000 ක පමණ වූ තමාගේ ජීවිත විස්තරයක් :—

(i) පෞද්ගලික ඉතිහාසය හා පවුලේ විස්තර.

(ii) ප්‍රධාන අධ්‍යයන කටයුතු, විශේෂ ලැදිකම්, පෞරුෂත්වය හා නැඹුරුකම්.

(iii) නිරත වන ක්‍රීඩා හා විනෝද ක්‍රීඩා.

(iv) දක්ෂතා. (ගායනය, නැටුම්, සංගීත භාණ්ඩ.)

(v) ආගමික විශ්වාසයන් සහ/හෝ ශීල ධර්ම පිළිබඳ අදහස්.

(vi) වෘත්තීය අපේක්ෂාවන්.

(තෝරා ගනු ලබන අපේක්ෂකයාගේ ජීවිත විස්තරය පිටපත් කර වෙනත් නියෝජිතයින් හා නේවාසික වන ගෘහයේ මූලිකයින් අතර බෙදා හරිනු ලැබේ. ඒ නිසා එය ප්‍රසිද්ධ කිරීමට සුදුසු වන පරිද්දෙන් සකස් කළ යුතුය.)

(ආ) "මට වැටහෙන පරිදි මගේ රටේ ඉතා වැදගත් ප්‍රශ්නය හා ඒ විසඳීමට ඇති මාර්ග" යන මැයින් ස්වෝත්සාහයෙන් ඉංග්‍රීසියෙන් ලියන ලද වචන 700-1,000 ක පමණ වාක්‍ය රචනයක්.

(ඉ) "මා විශ්වාස කරන පරිදි ඉදිරි 20 වර්ෂය තුළදී අපට විසඳීමට සිදුවිය හැකි උග්‍රතම ලෝක ව්‍යාප්ත ගැටළුව කුමක් ද ?" යන මාතෘකාව යටතේ ස්වෝත්සාහයෙන් ඉංග්‍රීසියෙන් ලියන ලද වචන 700-1000 ක පමණ වාක්‍ය රචනයක්.

(ඊ) පහත සඳහන් පරිදි නිර්දේශ ලිපි තුනක් :

(1) අයදුම්කරුගේ අධ්‍යයන දක්ෂතා හා චරිතය සහතික කළ හැකි ආචාර්යවරයෙකුගෙන්/කථිකාචාර්යවරයෙකුගෙන් එකී සහතිකයක්.

(2) අවුරුදු කීපයක් තුළ අයදුම්කරු දන්න සිටි (ඥාතීන් නොවන) වැදගත් හා වගකිව හැකි වැඩිහිටියන් දෙදෙනෙකුගෙන් සහතික.

**සංලක්ෂය.**—ජීවිත විස්තරය හා වාක්‍ය රචනා දෙක අයදුම්කරු ස්වෝත්සාහයෙන් ම ලියූ ඒවා විය යුතු අතර ඒවා අයදුම් කරු ස්වෝත්සාහයෙන්ම ලියන ලද ඒවා බවට ඒවා මත විද්‍යාලයාධිපති/විනෙතෘවරයා සහතික කළ යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයාගේ එකී ලියවිලි තුන එක්සත් ජනපදයට යවනු ලැබේ. ඒ නිසා ඒවා දෙකට නැමූ (රූල් සහිත) f පුල්ස්කැප් කඩදාසිවල වම් පැත්තේ අඟල් 1½ ක පමණ තීරයක් හිස්ව තබා සකස් කළ යුතුය.

අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය 1970.10.31 වෙයි. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. එසේම අසම්පූර්ණ අයදුම් පත් හා මේ නිවේදනයේ නියමයනට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7 ක් ඇතුළත අයදුම් පත ලද බවට දැන්වීමක් නොලද හොත් ඒ බව වහාම මේ කාර්යාලයට දැනුම් දිය යුතුය.

7. **තේරීම.**—අයදුම් පත්, ජීවන විස්තර හා වාක්‍ය රචනා දෙක පරීක්ෂා කර බලා මණ්ඩලයක් විසින් මූලික තේරීම් කරනු ලැබේ. ඒ අනුව තෝරා ගනු ලබන ස්වල්ප දෙනෙකු (කොළඹදී පැවැත්වෙන) සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. විනිශ්චය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඒ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ගේ ඉංග්‍රීසි ප්‍රවීණත්වය හා චතුරත්වයද, ලංකාව ගැන හා ලෝක ප්‍රශ්න ගැන හිතිවනම කථා කිරීමේ පුළුවන්කමද පරීක්ෂා කරනු ලැබේ.

එදිනම, විනිශ්චය මණ්ඩලය හෝ එම මණ්ඩලය විසින් නම් කරණ පරිපාලකයකු ඉදිරියේදී, මණ්ඩලය විසින් ඒ අවස්ථාවේදී නියම කරන මාතෘකාවක් යටතේ වචන 500 ක පමණ තවත් වාක්‍ය රචනාවක් කිරීමට අයදුම්කරුවනට නියම කරනු ලැබේ. මේ වාක්‍ය රචනය අයදුම්කරුවන්ට ඉංග්‍රීසියෙන් ලිවීමේ ප්‍රවීනත්වය හා විවිධ කරුණු ගැන ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා අදහස් කැරෙන්නකි. මේ වාක්‍ය රචනය ද, අයදුම්පත සමඟ කලින් එවන වාක්‍ය රචනා දෙක සමඟ සසඳා බලනු ලැබේ.

8. කිසියම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කිසියම් අන්දමක බලපෑමක් සිදුවෙතොත් හුදෙක් ඒ හේතුවෙන්ම එම අයදුම්කරු නුසුදුසු ලෙස ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.**

**1970 ඔක්තෝබර් මස 9 වැනි දින,**
**කොළඹ 2, මැලේ වීදියේ**
**අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.**

10–606—70.10.16 දින අංක 14,928 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | හවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී